ජාතික තරුණ සේවා සභාව

தேசிய இளைஞர் சேவைகள் மன்றம் National Youth Services Council



2021 වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை ANNUAL REPORT

වාර්ෂික වාර්තාව

2021

ජාතික තරුණ සේවා සභාව

හැඳින්වීම

1979 වර්ෂයේ අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත මඟින් පිහිටුවන ලද ජාතික තරුණ සේවා සභාව, ශ්‍රී ලංකාවේ තරුණ ප්‍රජාවගේ අභිවෘද්ධිය සඳහා කැප වූ ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස හැඳින්විය හැකිය. ආයතනයේ ප්‍රධානතම අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහිලා දශක හතරකට වැඩි කාලයක් තිස්සේ ඉතා සක්‍රීය ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. ආයතනයේ 2021 වසර තුළ, විවිධ බාධක, ව්‍යසනයන් හමුවේ ද නොයෙක් ජයග්‍රහණ ලබා ඇති අතර, අභියෝග ජය ගනිමින් විවිධ ක්‍රියාකාරකම් වල නිරත විය. මෙහිලා ලබා ගත් ප්‍රතිඵල මෙම 2021 වාර්ෂික වාර්තාව තුළ අන්තර්ගතව පවතී. මහරගම ප්‍රධාන මූලස්ථානය හා සම්බන්ධ පළාත් කාර්යාල 09ක් ද දිස්ත්‍රික් කාර්යාල 25ක් හා පුහුණු මධ්‍යස්ථාන 54ක් ද ප්‍රධාන ගොවිපළ 19 ක් ද දිවයින පුරා පිහිටා ඇති අතර, මේ හරහා අතිශයින්ම පෘථුල වූ සේවාවන් තාරුණ්‍යය වෙත ඵලදායී හා කාර්යක්ෂමව ලබා දුන් අයුරු ද මෙම වාර්තාව තුළ අන්තර්ගතව ඇත. තවද ඉදිරි ඉලක්ක ජයග්‍රණය කිරීමට යොදා ගත් උපක්‍රම හා ඉන් ලබා ගත් ප්‍රතිඵලයන් මේ තුළින් දක්වා ඇත.

බාහිර පාර්ශවයන්ට ද ආයතනය පිළිබඳ ප්‍රතිරූපයක් ගොඩනගා ගැනීමට මෙන්ම වර්ෂය තුළ ලබා දුන් ප්‍රතිපාදනවලට සාපේක්ෂව සිදු කර ඇති තරුණ සංවර්ධන වැඩසටහන්හි කාර්යසාධනය මැන බැලීම ද වැදගත් වේ. තවද රාජ්‍ය නොවන හා තරුණ කටයුතු ක්‍රියාත්මක කරනු ලබන පාර්ශවයන්ට තරුණ සේවා සභාව සමඟ අත්වැල් බැඳගැනීමට අවශ්‍ය තීරණ රැසක් මෙම වාරෂික වාර්තාව තුළින් ලබා ගැනීමට හැකියාවක් ඇත.

ශ්‍රී ලාංකේය තරුණ ප්‍රජාවගේ කාලීන අවශ්‍යතා හඳුනා ගනිමින් ඔවුනට සෘජු ප්‍රතිලාභ ලබා දීම සඳහා විවිධාංගීකරණය වූ කාලෝචිත වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. රටේ පවත්නා ආර්ථික අර්බුදයට මුහුණ දීමට හැකි පරිදි තරුණ තරුණියන් ගෙවතු වගා හා කෘෂිකර්මාන්තයට යොමු කිරීම, ව්‍යවසායකත්ව සංවර්ධනය කිරීම (HOPE 4 Sri Lanka), තරුණ ක්‍රියාදාමයන් ඩිජිටල්කරණය කිරීම, දේශීය හා විදේශීය වෙළෙඳපොල ඉලක්ක කරගත් වෘත්තීය පුහුණු හා විවිධ තරුණ කුසලතා සංවර්ධනය අරමුණු සාධනය වන ආකාරයේ වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කර ඇත. තරුණ තරුණියන්ගේ අධ්‍යාපන හා පුහුණු පැතිකඩ සංවර්ධනය සඳහා වෘත්තීය පුහුණු, ක්‍රීඩා, සෞන්දර්ය වැඩසටහන්, ව්‍යවසායකත්ව සංවර්ධනය උදෙසා ව්‍යාපාරික අවස්ථා හඳුන්වා දීම, තාක්ෂණය හඳුන්වා දීම, තරුණ සහභාගීත්වය හා පිළිගැනීම සඳහා තරුණයා සවිබල ගැන්වීමට සංවිධානගත කිරීම, ඔවුන්ගේ නායකත්ව හා පෞරුෂ සංවර්ධනය, මත්ද්‍රව්‍ය උවදුරෙන් තරුණ ප්‍රජාව ගලවා ගැනීමේ වැඩසටහන්, කාර්යමණ්ඩල බල ගැන්වීම, තාක්ෂණ උපක්‍රම ආයතනය තුළ සවිමත් කිරීම 2021 වසර තුළ සිදු වූ සුවිශේෂී ප්‍රයත්නයන්හි ප්‍රතිඵල ලෙස දැක්විය හැකිය.

ආයතනයේ භෞතික හා මූල්‍ය ඉලක්ක කරා ගමන් කිරීමේදී විවිධ දුෂ්කරතා හමුවේ අති විශාල සේවා රැසක් තරුණ ප්‍රජාව වෙත දායාද කිරීමේ අභිප්‍රායෙන් ක්‍රියාත්මක කළ ක්‍රියාන්විතයේ තොරතුරු 2021 වාර්ෂික වාර්තාවෙන් හෙළිකර ඇත.

ජාතික තරුණ සේවා සභාවේ සියලු ආයතනික කාර්යයන් සාර්ථක කර ගැනීම සඳහා මාර්ගෝපදේශකත්වය නායකත්වය සපයනු ලැබූ තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් තුමා ඇතුළු සියලු නිළධාරීන්ට ද ජාතික තරුණ සේවා සභාවේ සභාපති / අධ්‍යක්ෂ ජනරාල්තුමා ඇතුළු සියලුම කාර්ය මණ්ඩලය ද ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරමු.

සැලසුම් හා ප්‍රගති සමාලෝචන අංශය

දැක්ම

බලසතු වූ ශ්‍රී ලාංකීය තරුණයෙක්.

මෙහෙවර

දේශීය හා ජාත්‍යන්තර අවස්ථා උපයෝගී කොටගෙන ජීවිත අභියෝග සඳහා මුහුණ දීමට ශ්‍රී ලාංකීය තරුණයා සවිබල ගැන්වීම සඳහා පහසුකම් සැපයීම.

අරමුණු

- ජාතික හැඟීම පිළිබඳ උද්යෝගයක්, විනය පිළිබඳ හැඟීමක්, සමාජ හා ආර්ථික ගැටළු පිළිබඳ අවබෝධයක් සහ ශ්‍රමාභිමානය පිළිබඳ හැඟීමක් තරුණයන් අතර පෝෂණය කිරීම.

- ජාතික සංවර්ධන යෝජනා ක්‍රමයන්හි තරුණයන්ගේ සහභාගිත්වය ඇති කර ගැනීම.

- ශ්‍රී ලංකාවේ හා වෙනත් රටවල තරුණයන් අතර සුහදතාවය සහ අන්‍යෝන්‍ය අවබෝධය ප්‍රවර්ධනය කිරීම.

- තරුණයන් අතර තරගකාරිත්වය හා ජයග්‍රහණය පිළිබඳ හැඟීම සඳහා දිරිගැන්වීම.

- තරුණයන්ගේ දැනුම පුළුල් කිරීම සහ සංවර්ධනයට අදාළ ක්ෂේත්‍රයන්හි පුහුණුවීම ලබාදීම.

- තරුණයන් අතර සංස්කෘතික සාහිත්‍යමය හා කලාත්මක ක්‍රියාකාරකම් සඳහා දිරි ගැන්වීම

- තරුණයන් අතර ශාරීරික ප්‍රාගුන්‍යය හා ක්‍රීඩා වර්ධනය සඳහා දිරි ගැන්වීම.

- තරුණයන් සඳහා විනෝද කටයුතු සහ විනෝද සැපයුම් පිළිබඳ පහසුකම් සැලසීම.

- ආබාධිත තරුණයන්ට සහය වීම.

- රජයේ ආර්ථික සැළසුම ශක්තිමත් කිරීමේ අරමුණ ඇතිව, දීර්ඝ කාලීන ප්‍රතිපත්ති පදනමක් මත ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීමෙන් තරුණයන් සඳහා ක්‍රමික සේවා නියුක්තිය සඳහා අවස්ථාව සැලසීම.

- ප්‍රතිපත්ති සැකසීමේ හා ක්‍රියාත්මක කිරීමේ දී තරුණයන්ගේ සහභාගිත්වය සඳහා අවස්ථාව සැලසීම.

- තරුණ සංවිධානය පිහිටුවීම සහ තරුණ සුභ සාධනය සඳහා දැනටමත් පිහිටුවා ඇති සංවිධාන වලට සහය වීම.

- තරුණ සේවා ව්‍යාප්තිය සැළසුම් කිරීම, ඒකාබද්ධ කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ මෙහෙයවීම.

- එක් එක් තරුණයාගේ ආවේනික ලක්ෂණ වර්ධනය කිරීම.

.

පටුන

හැදින්වීම II

දැක්ම III

මෙහෙවර III

අරමුණු IV

1.ජාතික තරුණ සේවා සභාව 3

1.1 සංවිධාන ව්‍යුහය 4

1.2. සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛණය 5

2. විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේ සාමාජිකයින් 6

3. ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ විස්තරය 7

3.1 ජාතික තරුණ සේවා සභාවේ 2021 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම් 7

3.2 ජාතික තරුණ සේවා සභාවේ 2021 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම්. 8

3.3 ජාතික තරුණ සේවා සභාව වෙත භාණ්ඩාගාරය, අභ්‍යන්තර ඉපයීම් සහ වෙනත් බාහිර ආයතන මඟින් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන වලින් දරණ ලද පරිපාලන හා සංවර්ධන වියදම් (රුපියල් මිලියන) 9

3.4 සංවර්ධන වැඩසටහන් වියදම් සාරාංශය - 2021 10

4. සංවර්ධන ක්‍රියාකාරකම් - 2021 11

4.1 තරුණ සංවිධාන හා සංවර්ධන ක්‍රියාකාරකම්. 11

4.2 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ක්‍රියාකාරකම් 13

4.3 ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් 13

4.4 සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් 17

4.5 කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් 20

4.6 ජාත්‍යන්තර තරුණ සබඳතා 21

4.7 නිස්කොා විඩියෝ ක්‍රියාකාරම් 22

4.8 කෘෂි සංවර්ධන ක්‍රියාකාරකම් 22

4.9 සැළසුම්, ප්‍රගති සමාලෝචන හා නිළධාරී පුහුණු 24

4.10 මාධ්‍ය අංශය 24

4.11 තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම්. 25

4.12 විභාග හා ඇගයීම් 25

4.13 විශේෂ ව්‍යාපෘති 26

4.14 යෞවන තිළිණ ප්‍රදානය 27

4.15 ව්‍යවසායකත්ව සංවර්ධනය හා රැකියා උත්පාදනය, ... 28

5.පාලන අංශයේ ක්‍රියාකාරකම් 28

5.1.ආයතනික කටයුතු. 28

5.2 ප්‍රසම්පාදන කටයුතු 29

5.3 ප්‍රවාහන කටයුතු 29
5.4 අභ්‍යන්තර විගණක කටයුතු..... 29
5.5 ලේකම් කාර්යාලය හා සම්බන්ධ කටයුතු 29
5.6 නීති විමර්ශන ක්‍රියාකාරකම්..... 29
5.7 ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරකම්. 29
5.8 තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා 2021 වසර තුළ දරන ලද ප්‍රයත්නයන්..... 30
6. ස්වේච්ඡා වැඩසටහන්..... 31
7. කාර්යසාධන වාර්තාව - 2021 32
අ.ආයතනයේ කාර්ය සාධනය 32
ආ. කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග..... 34
09.ආශ්‍රිත වාර්තා / ලේඛන. 43
ඇමුණුම 01 - විගණක කමිටු වාර්තාව..... 44
ඇමුණුම් 02 – මූල්‍ය විගණක ප්‍රකාශය. 45
ඇමුණුම් 03 - විගණකාධිපති වාර්තාව හා ජාතික තරුණ සේවා සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව 47
ඇමුණුම් 04 - ජාතික තරුණ සේවා සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධ ප්‍රගතිය..... 56

1.ජාතික තරුණ සේවා සභාව

ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ පූර්ණ වර්ධනය සහතික කිරීමට හැකිවන පරිදි ඔවුන්ගේ ස්වාර්ථයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පිහිටුවා ඇති එකම රාජ්‍ය ආයතනය ජාතික තරුණ සේවා සභාව වේ.

<u>ජාතික තරුණ සේවා සභාව පිහිටුවීමට අදාළ පාර්ලිමේන්තු පනත් :-</u>

- 1967 වර්ෂයේ අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා පනත.
- 1968 වර්ෂයේ අංක 52 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධිත) පනත.
- 1969 ජනවාරි 23 වන දින අංක 14837/6 දරණ අති විශේෂ ගැසට් පත්‍ර මඟින් පනතේ 26 වන ඡේදයට අනුව රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත් කිරීම.
- 1979 වර්ෂයේ අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත.
- 1979 දෙසැම්බර් මස 20 වන දින අංක 67/09 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මගින් 1967 අංක 11 දරණ ස්වේච්ඡා ජාතික තරුණ සේවා (සංශෝධන) පනත අහෝසි කිරීම හා 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත ක්‍රියාත්මක කරන දිනය ප්‍රකාශයට පත් කිරීම.
- 1980 ජනවාරි මස 02 වන දින අංක 69/09 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ රෙගුලාසි මාලාව ප්‍රකාශයට පත්කිරීම.
- 1986 මාර්තු මස 10 වන දින අංක 392/05 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් 1979 ජාතික තරුණ සේවා පනතේ 34 වන වගන්තිය යටතේ 1986 අංක 01 දරණ ජාතික තරුණ සේවා නියෝග ප්‍රකාශයට පත්කිරීම.
- 1990 පුනරුත්ථාපන කොමසාරිස් ජනරාල් කාර්යාලය ජාතික තරුණ සේවා සභාවට අන්තර්ග්‍රහණය කිරීම.
- 2011 වසරේ ශ්‍රී ලංකා යුත් සංකල්පය ආරම්භ වීම.

1978 වසරේ යෞවන කටයුතු හා රැකී රක්ෂා අමාත්‍යාංශය පිහිටුවීමත් සමඟ සම්මත වූ 1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත යටතේ ජාතික තරුණ සේවා සභාවට පෙරට වඩා පුළුල් බලතල සහිතව තරුණ සංවර්ධන කටයුතු වන නියැලීමට අවකාශය ලැබුණි.

1.1 සංවිධාන ව්‍යුහය



1.2. සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ නාම ලේඛණය

අනු අංකය	නාම ලේඛණය	තනතුර
01.	තෙෂාර ජයසිංහ මහතා (2021.04.06 සේවය අවසන් කර ඇත.)	සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්
02.	දමිත වික්‍රමසිංහ මහතා (2021.04.07 පත් කර ඇත.)	සභාපති/ අධ්‍යක්ෂ ජනරාල්
03.	ඩබ්.ඒ.ජේ.සි. වික්‍රමආරච්චි මහත්මිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
04.	විමල් එස්. කේ. ලියනගම මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
05.	රංජිත් චන්ද්‍රසේකර මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
06.	එම්.එච්.ජී. බණ්ඩාර මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
07.	සංජීව රුවන් පතිරණ මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
08.	සහන් ද සිල්වා මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
09.	එස්.ඒ. අතුල ශාන්ත මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
10.	හේමන්ත ශ්‍රීලාල් මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
11.	එල්.බී. ඉසංක චතුරංග මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
12.	අජන්තන් ශිවතාස් මහතා (2021.11.12 ඉල්ලා අස් වී ඇත)	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
13.	පි.එච්.ඒ.ඩි. මදුෂංක මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
14.	චරිතා පියදර්ෂණී පිරිස් මහත්මිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
15.	ඩි.පි. මහේෂ් ප්‍රමුදිත මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
16.	දමිත් රණසිංහ මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
17.	ඩී. එච්. එන්. වීරසේකර මහත්මිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
18.	ඒ. සුහානි සදීෂා මෙනවිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
19.	ඉරාජ් වීරරත්න මහතා (2021.08.25 ඉල්ලා අස් වී ඇත.)	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
20.	ටෙහානි ඉමාරා මෙනවිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
21.	එච්. ඩී. එන්. කුමාරි තිලකරත්න මෙනවිය	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
22.	සුමුදු ඒකනායක මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
23.	සු. බණ්ඩාර කරුණාරත්න මහතා	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
24.	දමිත් ලොකුබණ්ඩාර මහතා (2021.05.19 දින පත් කර ඇත.)	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
25.	දුෂාන්ති හපුගොඩ මහත්මිය (2021.05.19 දින පත් කර ඇත.)	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
26.	කේ. එල්. කැලුම් ප්‍රියංකර (2021.11.05 දින පත් කර ඇත.)	සභා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

2. විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේ සාමාජිකයින්

1. ඩබ්.ඒ.ජේ.සී වික්‍රමආරච්චි මහත්මිය - කමිටු සභාපති
   නියෝජ්‍ය අධ්‍යක්ෂ,
   ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව,
   මුදල් අමාත්‍යාංශය,
   කොළඹ 07.

2. එස්.ඒ.අතුල ශාන්ත මහතා - කමිටු සාමාජික
   සහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික.

3. දමිත් රණසිංහ මහතා - කමිටු සාමාජික
   සහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික.

4. එස්.එන්.හපුආරච්චි මහත්මිය - නිරීක්ෂක
   ප්‍රධාන අභ්‍යන්තර විගණක,
   තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය.

5. ඩබ්.පී.ඩී.එම්.ජේ.පෙරේරා මහතා - නිරීක්ෂක
   ප්‍රධාන අභ්‍යන්තර විගණක,
   තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය.

6. එච්.කේ.අයි. ගයානි මහත්මිය - ආරාධිත
   විගණන අධිකාරී,
   ජාතික විගණන කාර්යාලය.

7. සී.කේ.හේරත් මහත්මිය - ලේකම්/කැඳවුම්කරු
   අභ්‍යන්තර විගණක
   ජාතික තරුණ සේවා සභාව.

මූලාශ්‍රය - අභ්‍යන්තර විගණන අංශය, ජාතික තරුණ සේවා සභාව,මහරගම.

3. ජාතික තරුණ සේවා සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ විස්තරය

3.1 ජාතික තරුණ සේවා සභාවේ 2021 වර්ෂයේ ප්‍රතිපාදන ලැබීම්.

(රු. 000)

		2021
භාණ්ඩාගාර		
	පුනරාවර්තන	1201.441
	ප්‍රාග්ධන	508.021
මුළු භාණ්ඩාගාර ප්‍රතිපාදන		**1709.462**
අමාත්‍යාංශ		
	පුනරාවර්තන	142.567
	ප්‍රාග්ධන	2.147
මුළු අමාත්‍යාංශ ප්‍රතිපාදන		**144.714**
පලාත් සභා		
	පුනරාවර්තන	200.00
පලාත් සභා		
විදේශ සංවිධාන		
	පුනරාවර්තන	29.946
	ප්‍රාග්ධන	4.551
වෙනත් බාහිර ආයතන මුළු ලැබීම්		
	අභ්‍යන්තර ආදායම්	155.363

3.2 ජාතික තරුණ සේවා සභාවේ 2021 වර්ෂයේ ප්‍රතිපාදන ගෙවීම්.

(රු. 000)

		2021
භාණ්ඩාගාර		
	පුනරාවර්තන	1201.441
	ප්‍රාග්ධන	508.021
මුළු භාණ්ඩාගාර ගෙවීම්		**1709.462**
අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන වැය		
	පුනරාවර්තන	102.120
	ප්‍රාග්ධන	2.147
මුළු අමාත්‍යාංශ ගෙවීම්		**104.267**
පලාත් සභා		
	පුනරාවර්තන	363.00
මුළු පලාත් සභා ගෙවීම්		
විදේශ සංවිධාන		
	පුනරාවර්තන	12.530
	ප්‍රාග්ධන	4.954
වෙනත් බාහිර ආයතන වැය		
අභ්‍යන්තර ඉපයීම් වැය		
	පුනරාවර්තන	38.416
	සංවර්ධන	99.350
	ප්‍රාග්ධන	3.602

- 2021 වර්ෂයේ පලාත් සභා (පුනරාවර්තන) වැය දැරීම් සඳහා පූර්ව වර්ෂයේ පළාත් සභා ඉතිරිය භාවිතා කර ඇත.
- විදේශ සංවිධාන (ප්‍රාග්ධන) වැය දැරීම් සඳහා පූර්ව වර්ෂයේ ඉතිරි මුදල් භාවිතා කර ඇත.

3.3 ජාතික තරුණ සේවා සභාව වෙත භාණ්ඩාගාරය, අභ්‍යන්තර ඉපයීම් සහ වෙනත් බාහිර ආයතන මඟින් සෘජු හා වක්‍ර ලෙස ප්‍රතිපාදන වලින් දරණ ලද පරිපාලන හා සංවර්ධන වියදම් (රුපියල් මිලියන)

2016 – 2021

වර්ෂය	2016	2017	2018	2019	2020	2021
සංවර්ධන	768	1212	1115	575	427	488
පරිපාලන	1014	1075	1124	1309	1223	1240



3.4 සංවර්ධන වැඩසටහන් වියදම් සාරාංශය - 2021

අනු අංකය	වැඩසටහන	වෙන් කල මුදල (රු.මි.)		වැය කල මුදල (රු.මි.)	
		භාණ්ඩාගාර	අමාත්‍යාංශය	භාණ්ඩාගාර	අමාත්‍යාංශය
01	සෞන්දර්ය කුසලතා සංවර්ධන වැඩසටහන	89.93	-	69.943	1.395
02	ජාත්‍යන්තර තරුණ සබඳතා වැඩසටහන්	16.05		12.046	-
03	තරුණ නායකත්ව සංවර්ධන වැඩසටහන		132.40		43.858
04	යෞවන තිළිණ ප්‍රධාන වැඩසටහන්	13.80		4.135	
05	ක්‍රීඩා සංවර්ධන වැඩසටහන	100.26		99.586	0.175
06	රැකියා අභිමුඛ පාඨමාලා හා විභාග ඇඟයීම්	304.93		125.788	37.428
07	තරුණ ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන	51.60		3.688	
08	තරුණ ගොවිපොල සංවර්ධන වැඩසටහන	50.00		36.009	
09	මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන්	11.64		9.552	0.243
10	නිස්කෝ විඩියෝ ක්‍රියාකාරකම්	5.00			
11	සැළසුම් , ප්‍රගති හා නිළධාරී පුහුණු වැඩසටහන්	16.18		8.184	
12	තොරතුරු තාක්ෂණ වැඩසටහන්	19.00		17.193	
13	පර්යේෂණ , කාර්යසාධන ඇඟයීම් වැඩසටහන්	5.00			
14	ඉදිකිරීම් හා අළුත්වැඩියා	119.17		98.380	
15	ප්‍රාග්ධන භාණ්ඩ අත්පත්කර ගැනීම	17.5		17.057	
16	තරුණ පාර්ලිමේන්තු ධාරිතා සංවර්ධන වැඩසටහන	-	118.30		31.809
17	වෘත්තිය මාර්ගෝපදේශන හා උපදේශන සේවා වැඩසටහන්	3.30		0.689	
18	ඉඩම්	6.6		5.822	
	එකතුව	829.96	250.70	508.072	114.908

4. සංවර්ධන ක්‍රියාකාරකම් - 2021

4.1 තරුණ සංවිධාන හා සංවර්ධන ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ තරුණ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තරුණ පෙළ සංවිධාන ගත කිරීම, එසේ සංවිධානගත වූ තරුණ පෙළ සමඟ ඔවුන්ගේ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම හරහා වඩා ඵලදායී ලෙස එම සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසරය සැකසීම මෙන්ම මෙරට ක්‍රියාත්මක තරුණ සංවිධානයන්ට සිය සේවාවන් වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කරලීම වෙනුවෙන් ජාතික තරුණ සේවා සභාව සතු ශක්තීන් හරහා එම සංවිධානයන් බල ගැන්වීම තරුණ සංවිධාන සංවර්ධන අංශයේ ප්‍රධානතම කාර්ය භාරය වේ.

මෙරට තරුණ ප්‍රජාවේ නායකත්වය හා පෞරුෂ සංවර්ධනය, තරුණ සංවිධානයක් ලෙස යෞවන සමාජ ව්‍යාපාරයේ සංවර්ධනය, ඔවුන් තීරණ ගැනීමේ ක්‍රියාවලියට සක්‍රීයව දායක කරගැනීම, රට තුළ වෙසෙන සියළුම ජාතීන් අතර සමඟිය හා මිත්‍රත්වය වැඩි දියුණු කිරීම වැනි අරමුණු ජයගැනීම පිණිස විවිධ වූ ව්‍යාපෘති වැඩසටහන් හරහා දායකත්වය සැපයීමද මෙම අංශය මඟින් සිදු කරනු ලබයි.

2021 වර්ෂයේ දී යෞවන සමාජ සම්මේලනයේ ලියාපදිංචි යෞවන සමාජ තොරතුරු

අනු අංකය	දිස්ත්‍රික්කය	ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව	පිහිටුවීමට නියමිත යෞවන සමාජ සංඛ්‍යාව	පිහිටුවා ඇති මුළු යෞවන සමාජ සංඛ්‍යාව	මුළු යෞවන සමාජ සාමාජික සංඛ්‍යාව	පිහිටුවා ඇති යෞවන සමාජ ප්‍රමාණය % ලෙස
01.	කොළඹ	13	557	426	8441	76.48%
02.	ගම්පහ	13	1177	902	20966	76.63%
03.	කළුතර	14	762	524	10033	68.76%
04.	ගාල්ල	19	896	768	16467	85.71%
05.	මාතර	16	650	558	10415	85.84%
06.	හම්බන්තොට	12	576	548	11773	95.13%
07.	මහනුවර	20	1188	878	18815	73.9%
08.	මාතලේ	11	545	449	9616	82.38%
09.	නුවරඑළිය	05	491	463	12212	94.29%
10.	මොණරාගල	11	319	332	8228	104%
11.	බදුල්ල	15	567	554	13490	97.7%
12.	කෑගල්ල	11	573	586	11193	102.26%
13.	රත්නපුර	17	575	588	14394	102.26%
14.	කුරුණෑගල	30	1610	1373	29012	85.27%
15.	පුත්තලම	16	548	533	11061	97.26%
16.	අනුරාධපුරය	22	694	587	13771	84.58%
17.	පොලොන්නරුව	07	295	275	6459	93.22%

18.	**ත්‍රීකුණාමලය**	**11**	**230**	**263**	**8577**	**114.34%**
19.	**මඩකලපුව**	**14**	**348**	**380**	**17210**	**109.1%**
20.	**අම්පාර**	**20**	**503**	**555**	**20720**	**110.33%**
21.	**වවුනියාව**	**04**	**102**	**113**	**3614**	**110.78%**
22.	**මන්නාරම**	**05**	**153**	**168**	**6857**	**109.8%**
23.	**කිලිනොච්චි**	**04**	**95**	**123**	**4916**	**129.47%**
24.	**මුලතිව්**	**06**	**136**	**142**	**3814**	**104.41%**
25.	**යාපනය**	**15**	**435**	**443**	**9136**	**101.83%**
එකතුව		**331**	**14025**	**12531**	**301190**	**89.34%**

ග්‍රාමීය මට්ටමේ තරුණ තරුණයන් සහභාගි කර ගනිමින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලැබේ. එනම්



*** "හුස්ම රකින තාරුණ්‍යය" වැඩසටහන -** දිවයින පුරා විසිරී සිටින තරුණ තරුණියන්ගේ සහභාගීත්වයෙන් රජයේ ජාතික වැඩපිලිවෙලක් වූ කොවිඩ් අතරමැදි මධ්‍යස්ථාන සඳහා ඇඳන් ලබා දීමේ ව්‍යාපෘතිය මඟින් දින 10ක් ඇතුළත ඇඳන් 3824ක් සෑදීමට සමත් විය.

*** ජාතික තරුණ දින වැඩසටහන -** හුස්ම රකින තාරුණ්‍යයෙන් ලක් දෙරණට පැළයක් දායාද කරමු නමින් මුළු දිවයිනම ආවරණය වන පරිදි තරුණ තරුණියන් 64,310කගේ සහභාගීත්වයෙන් පැළ 50,000ක් මැයි 23 වන දින රෝපණය කරන ලදි.



* අපේක්ෂා රෝහලේ කොවිඩ් ආසාධිත රෝගීන් සඳහා ශ්‍රී ලංකා යෞවන සමාජ සම්මේලනයේ ජාතික මණ්ඩල නියෝජිතයන් 15ක් හා සිවිල් ආරක්ෂක බලකායේ නියෝජිතයන් 25කගේ සහභාගීත්වයෙන් Global Wings Charity අනුග්‍රහක ආයතනයේ දායකත්වයෙන් **රෝගීන් 19ක් සඳහා වූ වාට්ටුවක්** ඉදිකරනු ලැබීය.

* යෞවන සමාජ ශක්තිමත් කිරීම සඳහා තරුණ තරුණියන් හා විද්වත් මණ්ඩල අතර සෘජු **සංවාද පැවැත්වීමේ වැඩසටහන** දිවයින පුරා දිස්ත්‍රික් වල පවත්වන ලදි.



*** Youth for Growth -** අවුරුදු 20 – 30 අතර තරුණ තරුණියන් සඳහා කොවිඩ් - 19 පාලන එන්නත්කරණය සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ නම් කරන ලද මධ්‍යස්ථානවල ස්වේච්ඡාවෙන් තරුණ තරුණියන්ගේ දායකත්වය ලබා දීම. මෙහිදී මධ්‍යස්ථාන 518ක ස්වෙච්ඡා දායකත්වය 2881 කි.

* **ධාරිතා සංවර්ධන පුහුණු වැඩසටහන -** දිස්ත්‍රික් 02ක ජාතික තරුණ සේවා සභාවේ මධ්‍යස්ථාන වල තරුණ තරුණියන් 92කගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

* **ස්වේච්ඡා දින පාසල් ශ්‍රමදාන වැඩසටහන -** දිවයින පුරා පැවැති කොවිඩ් - 19 වසංගත තත්වය හේතුවෙන් තාවකාලිකව වසා දමන ලද පාසල් නැවත ආරම්භ කිරීමට පෙර දිස්ත්‍රික්ක 25 පුරා පාසල් 330ක ශ්‍රමදාන වැඩසටහනක් පැවැත්වීම.

4.2 වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන ක්‍රියාකාරකම්.



ජාතික තරුණ සේවා සභාවේ වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශණ අංශය ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විතය.එයින් වෘත්තීය මාර්ගෝපදේශන කොටස යටතේ මුළු දිවයිනම ආවරණය වන පරිදි දිස්ත්‍රික් මට්ටමින් වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන 25 ක් ක්‍රියාත්මක වේ. 2021 වර්ෂයේදී වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන මධ්‍යස්ථාන හරහා වැඩසටහන් 32ක් 3032ක තරුණ සහභාගීත්වයකින් සිදු කරන ලදි. තවද වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන දැනුවත් කිරීමේ වැඩසටහන් 06ක් 56ක තරුණ සහභාගීත්වයකින් සිදු කරන ලදි. වැඩලෝකයට පිවිසීමට සූදානම් වීම, එහි නව ප්‍රවණතා හඳුනාගැනීම, වැඩලෝකයට පිවිසි තරුණ ප්‍රජාවට වෘත්තීය මග සැලසුම් කර ගැනීමට සහයවීම ආදී අරමුණු ප්‍රධාන කොටගෙන වැඩලෝකය හා තරුණ ප්‍රජාව අතර වූ සම්බන්ධීකරණ මධ්‍යස්ථානයක් ලෙස මෙම වෘත්තීය මාර්ගෝපදේශන මධ්‍යස්ථාන ක්‍රියාත්මක වේ.

4.3 ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම්

ජාතික තරුණ සේවා සභාවේ වාර්ෂික සංවර්ධන වැඩසටහන් අතුරින් ක්‍රීඩා සංවර්ධන වැඩසටහන් තාරුණ්‍යට වඩාත් ඵලදායි ලෙස 2021 වසරේදී ක්‍රියාත්මක කොට ඇත. සමස්ථ ශ්‍රී ලාංකේය යෞවන සමාජ සාමාජික සාමාජිකාවන්ගේ ක්‍රීඩා කුසලතාවන් ග්‍රාමීය මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා ඔසවා තබාගැනීම සඳහා වසර පුරා විවිධ ක්‍රීඩා වැඩසටහන් ක්‍රියාත්මක කරන ලද අතර, ඒ තුළින් ඔවුන් කායික හා මානසික වශයෙන් සෞඛ්‍ය සම්පන්න ශක්තිමත් තාරුණ්‍යයක් බවට පත්කොට ඔවුන් තුළ ජනිත වන තාරුණ්‍යයේ ජවය ජාතික සංවර්ධන ප්‍රවාහය වෙත මුදාහැරීමට හැකිවීම අප ලද සාර්ථකත්වය වේ. නීරෝගිමත් ශ්‍රී ලාංකේය තාරුණ්‍යයක් බිහිකිරීමේ පෙරගමන්කරු ලෙස ජාතික තරුණ සේවා සභාව වෙත සහාය වීම ප්‍රධාන අරමුණු කොටගත් ක්‍රීඩා සංවර්ධන අංශය 2021 වර්ෂයේදී ප්‍රධාන ව්‍යාපෘති පහක් ක්‍රියාත්මක කරන ලදී.

1. **33 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙල**



2021 වර්ෂයේදී 33 වැනි වතාවටත් අවු 15-29 අතර වයස් සීමාවේ සිටින යෞවන සමාජ වටා ඒකරාශී වී සිටින යෞවන සමාජ සාමාජික සමාජිකාවන්ගේ ක්‍රීඩා කුසලතාවයන් නංවාලීමේ අරමුණු පෙරදැරිව ප්‍රධාන වැඩසටහන් 04ක් ලෙස පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කරන ලදි.

අනු අංකය	වැඩසටහන හා පියවර	ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් ප්‍රමාණය	තරුණ සහභාගීත්වය
01	ප්‍රාදේශීය ක්‍රීඩා තරඟ	331	220064
02	දිස්ත්‍රික් ක්‍රීඩා තරඟ	26	35146
03	ජාතික මට්ටමේ කණ්ඩායම් තරඟ	22	4370
04	ක්‍රීඩා උළෙල	01	1708

- 2021 වර්ෂයේ 33 වෙනි ජාතික යෞවන ක්‍රීඩා උළෙලේ පහත සඳහන් පරිදී නව වාර්තා 11ක් පිහිටුවීමට සමත් විය.

අනු අංකය	**තරඟය**	**දක්ෂතාවය**	**ක්‍රීඩක/ක්‍රීඩිකාවගේ නම**	**දිස්ත්‍රික්කය**
01	යගුලිය විසිකිරීම	16.43 m	ඩබ්.එස්.මදුසංක	කොළඹ
02	කවපෙත්ත විසිකිරීම	43.33 m	එන්.පී.එල්.කේ.පතිරණ	රත්නපුර
03	මීටර් 800	1:54.23 Min	ඩී.බුළුගහපිටිය	මහනුවර
04	කඩුලු මතින් දිවීම 110 m	14.27 Sec	බී.ඒ.එස්.කේ.ඩයස්	කුරුණෑගල
05	4 x 100 m	42.25 Sec		පුත්තලම
06	කඩුලු මතින් දිවීම 100 m	14.97 Sec	එච්.ඒ.පී.හෙට්ටිආරච්චි	මහනුවර
07	මීටර් 400	56.00 Sec	ඩී.එස්.එල්.මෙන්ඩිස්	ගම්පහ
08	මීටර් 800	2:11.27 Min	කේ.එස්.ලක්ෂානි	ගම්පහ
09	මීටර් 1500	4:35.55 Min	කේ.එස්.ලක්ෂානි	ගම්පහ
10	හෙල්ල විසිකිරීම	42.35 m	ඩී.එම්.අයි.හසන්ති	අම්පාර
11	4 x 400 m	3:50.56 Min		ගම්පහ

02.තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය

2021 වර්ෂයේදී 34 වැනි වතාවටත් ප්‍රධාන තරඟාවලි දෙකක් යටතේ මෙම වැඩසටහන ක්‍රියාත්මක කළ අතර, රට තුළ පැවැති අර්බුදකාරී තත්ත්වය හේතුවෙන් අභියෝග ශූරතා තරඟාවලියේ ජාතික මට්ටමේ තරඟ පමණක් ක්‍රියාත්මක කරන ලදී.

අනු අංකය	තරඟාවලියේ ස්වභාවය	ක්‍රියාත්මක කළ වැඩසටහන් ප්‍රමාණය
01	තරුණ සේවා රූපවාහිනී අභියෝග ශූරතා දිස්ත්‍රික් තරඟාවලිය	26
02	තරුණ සේවා රූපවාහිනී අභියෝග ශූරතා ජාතික තරඟාවලිය	01



03. තරුණ සේවා විශේෂ ක්‍රීඩා සංචිත වැඩසටහන - හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය

වොලිබෝල් හා කබඩි ක්‍රීඩාව වෙනුවෙන් ජාතික තලයට කුසලතා පිරිපුන් ක්‍රීඩක ක්‍රීඩිකාවන් පුහුණු කිරීමේ අරමුණින් යුතුව හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් ක්‍රීඩා සංචිතය පවත්වන ලදී.

අනු අංකය	ක්‍රීඩා සංචිතය	වසර තුළ පුහුණුව ලැබූ සංඛ්‍යාව
01	වොලිබෝල් (පිරිමි)	27
02	වොලිබෝල් (කාන්තා)	
03	කබඩි (පිරිමි)	06

04. තරුණ සේවා ක්‍රීඩා සමාජ වැඩසටහන

ප්‍රධාන කාර්යාලීය තරුණ මධ්‍යස්ථානය කේන්ද්‍ර කොට ගනිමින් ක්‍රීඩා ඉසව් 18ක් පුහුණු කිරීමේ අරමුණු කොට ගෙන අර්ධ කාලීන වැඩසටහනක් ලෙස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන අතර, එහි සහභාගීත්වය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පහත පරිදි වේ.



රට තුළ පැවැති වසංගත තත්ත්වය හේතුවෙන් 2021 වසර පුරා මෙම ක්‍රීඩාවන් වසර පුරා අඛණ්ඩව ක්‍රියාත්මක නොවූ අතර, 2021 වර්ෂයේ සහභාගීත්වය ඉහත සටහනෙහි දැක්වේ.

05. Talent Hunt වැඩසටහන

ශ්‍රී ලාංකේය තාරුණ්‍ය යේ සැඟවුනු දක්ෂතා හා කුසලතාවන් හඳුනාගෙන විද්‍යානුකූල ක්‍රමවේදයන් භාවිතා කරමින් එම තරුණ ප්‍රජාව අවධිකරලීම හා ඔවුන් තුළ සැඟවී ඇති කායික හා මානසික ශක්තීන් අවධි කොට මළල ක්‍රීඩා, වොලිබෝල්, නෙට්බෝල් ආදී කණ්ඩායම් තරඟ ඉසව් සඳහා දක්ෂතාවන් පෙන්නුම් කරන ග්‍රාමීය මට්ටමේ සිටින ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ඔවුන්ගේ හැකියාව ඉස්මතු කරමින් ක්‍රීඩා ක්ෂේත්‍රයට දායාද කිරීම මෙහි අරමුණ විය.

අනු අංකය	තරඟාවලියේ ස්වභාවය	ක්‍රියාත්මක කළ වැඩසටහන් ප්‍රමාණය	තරුණ සහභාගීත්වය
01	දිස්ත්‍රික් මට්ටම	26	2332
02	ජාතික මට්ටම	01	51

ළඟා කරගත් විශේෂ ජයග්‍රහණ

ජාතික තරුණ සේවා සභාව ආරම්භක වකවානුවේ පටන් තාරුණ්‍යයේ මහගෙදර වූ මහරගම ජාතික තරුණ මධ්‍යස්ථානයට විශාල අඩුවක්ව පැවැති පිහිනුම් තටාකයක හිමිකම ලබාගැනීමට මෙම වසරේ අප භාග්‍යවන්තයන් වූ අතර, එය උපයෝගී කොට ගනිමින් ලබන 2022 වර්ෂයේ සිට සුවිශේෂී පුහුණු වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කිරීමට මේ වන විටත් අප සැළසුම් කොට ඇත.

4.4 සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම්

01. ජාතික යෞවන සම්මාන තරගාවලිය සහ උළෙල



තරුණ තරුණියන්ගේ සෞන්දර්ය කුසලතා හා දක්ෂතා ඇගයීමට ලක් කිරීම මෙම වැඩසටහන මඟින් සිදුවේ. ජාතික තරුණ සේවා සභාව මඟින් ජාතික යෞවන සම්මාන නමින් නිර්මාණකරුවන් ඇගයීමට ලක් කර සම්මාන පිරි නැමීමේ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන අතර එය දිස්ත්‍රික් පළාත් හා ජාතික ලෙස අදියර 03 ක් යටතේ ක්‍රියාත්මක වේ.

මෙහිදී නර්තන,සංගීත,නිවේදන,කථික,අභිරූපණ,චිත්‍ර, මූර්ති,කැටයම්,ඡායාරූප,සාහිත්‍ය හා ආබාධ සහිත තරුණ තරුණ තරුණියන්ගේ තරඟ අංශ ලෙස සිංහල,දමිළ සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් තරඟ පැවැත්වීම. මෙම සම්මාන උළෙලේ ජාතික මට්ටමේ තරඟාවලිය නියෝජනය කිරීම සඳහා තරුණ තරුණියන් 1485 ක් සහභාගී වූ අතර ප්‍රථම ස්ථානය නියෝජනය කරමින් සම්මාන 45 ක් ප්‍රදානය කිරීමට සමත් විය.

02. ජාතික යොවුන් නාට්‍ය උළෙල



තරුණ තරුණියන් අතර නාට්‍ය කලාව කෙරෙහි උනන්දුවක් ඇති කිරීම මෙමඟින් සිදුවේ. ප්‍රාදේශීය වශයෙන් නාට්‍ය කලාවට උනන්දුවක් දක්වන තරුණ නාට්‍යකරුවන්ගේ දක්ෂතාවයන් ජාතික මට්ටමට දක්වා ඇගයීම සඳහා මෙම ව්‍යාපෘතිය ස්ථාපනය කර ඇත. මෙම සම්මාන උළෙලෙහි ජාතික මට්ටමේ තරඟාවලිය නියෝජනය සඳහා තරඟකරුවන් 650ක පමණ සහභාගී විය.



03. සෞන්දර්ය නිකේතන සංවර්ධනය



සෞන්දර්ය ක්ෂේත්‍රය දියුණු කිරීම තුලින් සුභවාදී සමාජයක් ගොඩ නැංවීම ජාතික තරුණ සේවා සභාව මඟින් බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනය, එරමිණියාය සෞන්දර්ය නිකේතනය හා බටංගල සෞන්දර්ය නිකේතනය තුල සංගීතය හා නැටුම් යන අංශ ආවරණය වන ආකාරයට ඩිප්ලෝමා පාඨමාලා පවත්වනු ලැබේ. වසර 03 ක විධිමත් ඩිප්ලෝමා පාඨමාලාවක් ලෙස න්‍යායික හා ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇතුලත් පුහුණුවක් ලබාදීම තුලින් අභ්‍යාසලාභීන්ගේ සෞන්දර්යාත්මක දැනුම වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ. මෙම සෞන්දර්ය පාඨමාලාව සඳහා බෙල්වුඩ් සෞන්දර්ය නිකේතනයෙහි අභ්‍යාසලාභීන් 75 දෙනෙක්ද, බටංගල සෞන්දර්ය නිකේතනයෙහි අභ්‍යාසලාභීන් 100 දෙනෙක්ද, එරමිණියාය සෞන්දර්ය නිකේතනයෙහි අභ්‍යාසලාභීන් 50 දෙනෙක්ද, වශයෙන් අභ්‍යාසලාභීන් 225 දෙනෙකු සඳහා පාඨමාලාව හැදිරීමට පහසුකම් සපයන ලදි.

04. නාට්‍ය හා රංගකලා ඩිප්ලෝමා පාඨමාලාව

ප්‍රවීණතම හා දක්ෂතා ඇති තරුණ නාට්‍ය ශිල්පීන්ගෙන් සැදුම්ලත් සම්පත්ධාරී මඩුල්ලකගේ උපදේශකත්වයෙන් තරුණ නාට්‍ය ශිල්පීන් පිරිසකට ජාතික තලයට පිවිසීම සඳහා මාර්ගෝපදේශ ලබාදීම මෙමඟින් සිදුවේ. නාට්‍ය කලාවට ඇලුම් කරන ඒ පිළිබඳ උනන්දුවක් දක්වන දිවයින පුරා විසිරී සිටින තරුණ තරුණියන්ගේ කුසලතා වර්ධනය කිරීම මෙතුලින් බලාපොරොත්තු වේ. රඟපෑම, නිෂ්පාදනය, රචනය, අංග රචනා, පසුතල නිර්මාණ ආදී පුළුල් ක්ෂේත්‍රයන් ඔස්සේ දැනුම ලබා දෙමින් ශිල්පියෙකු බිහි කිරීම මෙම සය මාසික පාඨමාලාව තුලින් සිදු කරනු ලබයි. මෙම පාඨමාලාව අභ්‍යාසලාභීන් 35 දෙනෙකු හදාරන ලදි.



05. ජාතික සංස්කෘතික වැඩසටහන්

විවිධ ජාතීන්ගේ සංස්කෘතික සාරධර්ම තරුණ පරපුරට හඳුන්වා දීම සහ ජාතීන් අතර අනන්‍යෝන්‍ය සුහදත්වය වර්ධනය කිරීම සහ ජාතික අනන්‍යතාවයන් සහිත අභාවයට යමින් පවතින කලා අංග මතු පරපුර වෙනුවෙන් දායාද කිරීම මෙමඟින් අපේක්ෂා කෙරේ.මේ යටතේ තෛපොංගල් උළෙල,සිංහල දමිළ අලුත් අවුරුදු උළෙල,වෙසක් උළෙල,ආදිවාසී සංස්කෘතික උත්සවය,මිලාදුන් නබී උත්සවය,නත්තල උත්සවය ආදිය ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම වැඩසටහන සඳහා 250කට ආසන්න තරුණ පිරිසක් සහභාගී වන ලදි.





06. දිස්ත්‍රික් ලලිත කලා සංසද (ගම්දොරින් රඟමඩලට)

ලංකාවේ විවිධ දිස්ත්‍රික්ක වල විසිරී සිටින නාට්‍ය, නර්තන, සංගීත යන ක්ෂේත්‍රයන් නියෝජනය කරනු ලබන තරුණ තරුණියන්ට තම හැකියාවන් වර්ධනය කිරීමට අවස්ථාවක් හිමි වීම. විවිධ ආර්ථික දුෂ්කරතා මැද ශ්‍රී ලංකාවේ නාට්‍ය , නර්තන, සංගීත ක්ෂේත්‍රයන් තුල අද දවසේ රැඳී සිටින නිර්මාණ කරුවන් අති බහුතරයක් අග නුවරින් බැහැර විවිධ දිස්ත්‍රික්ක නියෝජනය කරමින් කලා ක්ෂේත්‍රයට ප්‍රවේශ වූවන් වේ. එබැවින් අගනුවරට පැමිණ තම හැකියාවන් සංවර්ධනය කර ගැනීමට තරුණ තරුණියන්ට ලැබෙන අවස්ථා සීමා සහිතය. දිස්ත්‍රික් මට්ටමින් ඒ සඳහා අවස්ථාව හිමි වන්නේ නම් ඒ තුලින් ඔවුන්ට තම කුසලතා සංවර්ධනය කර ගැනීමට මග පෑදෙනු ඇත. මෙම වැඩසහන දිස්ත්‍රික්ක 25 නියෝජනය වන පරිදි ක්‍රියාත්මක වූ අතර 730ක



තරුණ තරුණියන් පිරිසක් සහභාගී වන ලදි. දුෂ්කරතා ඇති තරුණ නිර්මාණ කරුවන්ට ජාතික මට්ටමට පිවිසීමට අවස්ථාව ලබා දීම මෙමඟින් සිදුවේ.

07. විශේෂ නර්තන හා සංගීත කණ්ඩායම.



කුසලතාවයන්ගෙන් පිරුණු විශේෂ දක්ෂතා ඇති තරුණ ප්‍රජාව සම්බන්ධ කර ගනිමින් ජාතික තලයෙන් ඔබ්බට ගිය ජාත්‍යන්තර මට්ටමේ සංස්කෘතික අත්දැකීම් බෙදා හදා ගැනීමට ලංකාවේ නිර්මාණශීලී තරුණ ප්‍රජාවට අවස්ථාව ලබා දීම මෙම වැඩසටහන මඟින් සිදුවේ. වර්තමානයේදී ජාතික තරුණ සේවා සභාව යටතේ මහරගම ප්‍රධාන පරිශ්‍රය ආශ්‍රිතව විශේෂ සංගීත කණ්ඩායමක් හා විශේෂ නර්තන කණ්ඩායමක් සාර්ථකව ක්‍රියාත්මක වන අතර එම කණ්ඩායම් බාහිර ප්‍රසංග, එළිමහන් සංදර්ශන හා විදේශ සංචාර සඳහා සහභාගිවන අතර, ඒ තුළින් මෙම කණ්ඩායම් වල තරුණ තරුණියන්ට ආර්ථික වටිනාකමක්ද එකතු වී ඇත. විශේෂ සංගීත කණ්ඩායම සඳහා තරුණ තරුණියන් 20 දෙනෙක්ද විශේෂ නර්තන කණ්ඩායම සඳහා තරුණ තරුණියන් 22 ක්ද ආල කණ්ඩායම් සඳහා නියෝජනය කරන ලදි.



08. නව නිර්මාණ එළිදැක්වීම.

තරුණ තරුණියන්ගේ නිර්මාණ සමාජගත කරමින් ඔවුන්ගේ වෘත්තීය මට්ටමට ගෙන ඒම සඳහා කටයුතු කිරීම මෙමඟින් සිදුවේ. යෞවන සම්මාන උළෙල, යොවුන් නාට්‍ය උළෙල, නාට්‍ය පාසල, සෞන්දර්ය නිකේතන ආදී විවිධ වැඩසටහන් ඔස්සේ හැකියා කුසලතා සහිත තරුණ තරුණියන් රැසක් වාර්ෂිකව ආයතනය සමඟ එක්වේ. ඔවුන්ගේ අධ්‍යාපන අවශ්‍යතා වෙනුවෙන් විශාල පිරිවැයක් යොදමින් කටයුතු කලද නව නිර්මාණ එළි දක්වමින් ඔවුන්ගේ හැකියා කුසලතා සමාජගත කිරීම සඳහා වැඩසටහන් 02ක් 108කගේ සහභාගීත්වයේ සිදු කිරීම ආරම්භ කරන ලදි.

09. **Be Happy With Youth** වැඩසටහන.

කොවිඩ් 19 වසංගතයෙන් පීඩා විඳිමින් හා කම්පන තත්වයට පත් ජනතාවගේ මානසික ආතතීන් හා පීඩනය අවම කිරීම උදෙසා සෞන්දර්යාත්මක අත්දැකීම් ලබා දීම මෙමඟින් බලාපොරොත්තු විය. රට පුරා ව්‍යාප්ත වෙමින් පැවති කොරෝනා රෝගී හා කොරෝනා රෝගය හේතුවෙන් පීඩා විඳිමින් සිටින ජනතාවගේ මානසික පීඩනය හා ආතතීන් අවම කිරීම උදෙසා දිවයින පුරා තෝරා ගත් මහල් නිවාස සංකීර්ණ,රෝහල් හා ප්‍රසිද්ධ ස්ථාන වල ක්‍රියාත්මක කරන ලදි. මේ සඳහා 5135ක සහභාගීත්වයෙන් වැඩසටහන් 59ක් පවත්වා ඇත.

4.5 කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්



ජාතික තරුණ සේවා සභාව මගින් පවත්වාගෙන යනු ලබන සියලුම වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන තත්ව කළමනාකරණ සහතිකය ලත් පුහුණු මධ්‍යස්ථාන බවට පරිවර්තනය කරමින්, දේශීය හා විදේශීය වෙළෙඳපොළ අවශ්‍යතාවයට ගැළපෙන නිපුනතා සම්මතයන්ට අනුව වෘත්තීය පුහුණුව ලබා දෙමින්, ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය ලත් පුහුණු ශ්‍රමිකයන් බිහි කිරීම මෙමඟින් සිදු කෙරේ.

2021 වර්ෂයේදී ද පැවැති කොවිඩ් - 19 තත්වය හමුවේ මාර්ගගත (zoom) තාක්ෂණය ක්‍රමය උපයෝගී කරගනිමින් තරුණ තරුණියන්ට වෘත්තීය පාඨමාලා සාර්ථකව ක්‍රියාත්මක කරනු ලැබීය.

<u>පුහුණු මධ්‍යස්ථාන තොරතුරු</u>

- මධ්‍යස්ථාන ප්‍රමාණය – 54
- පාඨමාලා ප්‍රමාණය – 81 (පූර්ණ කාලීන- 35 , අර්ධ කාලීන – 46)
- අභ්‍යාසලාභීන් ප්‍රමාණය - 15,653 (වාර්ෂිකව)
- NVQ මට්ටම් - NVQ III, IV , V
- පාඨමාලා කාලය - මාස 06, අවුරුදු 01, අවුරුදු 02

<u>NVQ පාඨමාලා සඳහා අභ්‍යාසලාභීන් බඳවා ගැනීම</u>
<u>2021 (පළාත් මට්ටමින්)</u>

පළාත	පුහුණු පාඨමාලා ප්‍රමාණය	බඳවා ගැනීම්	සම්පූර්ණ කළ ප්‍රමාණය	දැනට පුහුණුව ලබන අභ්‍යාසලාභීන්
බස්නාහිර	64	2662	2560	495
දකුණු	34	1040	970	122
සබරගමුව	13	452	359	103
ඌව	11	278	278	15
වයඹ	22	1164	974	191
මධ්‍යම	31	1213	1076	181
උතුරු මැද	16	539	471	15
නැගෙනහිර	33	916	892	66
වන්නි	04	142	142	0
උතුරු	01	31	31	0
එකතුව	**229**	**8437**	**5920**	**1188**

මෙම සියළුම පාඨමාලා NVQ මට්ටම් III,IV,V ලෙස වෙන් වෙන් වශයෙන් පවතී.

* කොවිඩ් - 19 වසංගත තත්වය හමුවේ පුහුණු පාඨමාලා සඳහා සෞඛ්‍ය ආරක්ෂිත නව ක්‍රමවේදයන් 2021 වසර පුරාවට ක්‍රියාත්මක කරන ලදි.

මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පුහුණු පාඨමාලා පැවැත්වීමට හැකි වන පරිදි තාක්ෂණික පද්ධති (NYSCLMS.COM) සකස් කිරීම විශේෂත්වයකි.



4.6 ජාත්‍යන්තර තරුණ සබඳතා

ශ්‍රී ලාංකීය තාරුණ්‍යයේ භාෂා කුසලතා (ඉංග්‍රීසි ව්‍යාකරණ හා කථන) / නායකත්ව කුසලතා / කණ්ඩායම් ක්‍රියාකාරකම් සංවර්ධනය කිරීම තුළින් නව සහස්‍රයට ගැලපෙන තාක්ෂණික දැනුමෙන් හා හැකියාවන්ගෙන් පරිපූර්ණ තාරුණ්‍යයක් බිහි කිරීම, දේශයේ සෞභාග්‍ය ගොඩනැගීමට දායකත්වයක් ලබාදෙන තරුණයාගේ කුසලතා, දැනුම සහ ආකල්ප, ජාත්‍යන්තරයට රැගෙන යාමට අවස්ථාව ලබාදීම, ගෝලීය වශයෙන් තරුණ තරුණියන් අතර අත්දැකීම් හා දැනුම බෙදා ගැනීමට අවස්ථාව ලබාදීම හා ජාතීන් අතර සමාජ විද්‍යාත්මක, ආර්ථික හා සංස්කෘතික තත්වයන් වර්ධනය කිරීම ආදී කටයුතු මෙමඟින් බලාපොරොත්තුවේ.



4.7 නිස්කෝ විඩියෝ ක්‍රියාකාරම්



තරගකාරී වාණිජ ලෝකයේ නොයෙකුත් අපහසුකම් නිසා සිය දක්ෂතාවන්ගෙන් ප්‍රයෝජන ගැනීමට ශ්‍රී ලාංකේය තාරුණ්‍යයට සුදුසු පරිසරයක් ගොඩනැගීම සඳහා රාජ්‍ය ආයතනයක මැදිහත්වීම උදෙසා ජාතික තරුණ සේවා සභාව විසින් නිස්කෝ වීඩියෝ අංශය ආරම්භ කරන ලදි.

විද්‍යුත් හා සමාජ මාධ්‍ය තුළින් **Sri Lanka Youth** සමාජගත කිරීම සඳහා අවශ්‍ය නිෂ්පාදන කටයුතු, රූපවාහිනිය හා සිනමාව සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන තරුණ තරුණියන් සඳහා දැනුම, ආකල්ප හා කුසලතා වලින් සන්නද්ධ කිරීම, ඔවුන්ගේ නිර්මාණ ජාතික තලයට රැගෙන යාමට අවශ්‍ය පරිසරය සැකසීම ප්‍රධාන කාර්යයන් වේ.

- **රූපවාහිනී ප්‍රවෘත්ති ආවරණය, වැඩසටහන් නිෂ්පාදනය හා සංස්කරණය -** ජාතික තරුණ සේවා සභාව මඟින් ක්‍රියාත්මක කෙරෙන සියලුම වැඩසටහන් ජනගත කිරීම සඳහා කටයුතු කරන ලදි. මේ සඳහා රූපවාහිනී මාධ්‍ය හා සමාජ මාධ්‍ය ශාලා (**Facebook**) උපයෝගී කර ගන්නා ලදි. තරුණ සංවර්ධන වැඩසටහන් 177ක් රූපවාහිනී මාධ්‍ය ඔස්සේ විකාශය කරන ලදි.

- **යෞවන චිත්‍රපට උළෙල (සිනමා අස්වැන්න) -** සහජ කලා හැකියාවන් සහිත තරුණ නිර්මාණකරුවන්ගේ සෞන්දර්ය කුසලතා වර්ධනය කරමින් නව සිනමා සංස්කෘතියක් බිහි කිරීම උදෙසා ඉහල රස වින්දනයක් හා තාක්ෂණික හැකියාවක් සහිත නව සිනමා පරපුරක් බිහිකර ඔවුන් ජාතික මෙන්ම ජාත්‍යන්තර තලයට හඳුන්වා දීම උදෙසා 2021 වසරේදී ද යෞවන චිත්‍රපට උළෙල 9 වන වරටත් ඉතා සාර්ථකව තරුණ නිර්මාණකරුවන් 105 දෙනෙකුගේ හා ප්‍රවීණ සිනමාකරුවන්ගේ සහභාගීත්වයෙන් නෙළුම් පොකුණ රඟහලේදී පැවැත්විය.



- **රූපවාහිනී වැඩසටහන් නිෂ්පාදන තාක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව** (NVQ 5) ද මෙම වසර තුළ සාර්ථකව පවත්වන ලදි.

4.8 කෘෂි සංවර්ධන ක්‍රියාකාරකම්



2021 වසරේදී සමාජය මුහුණ දුන් වසංගත තත්වයන් හමුවේ තරුණ තරුණියන් විවිධාකාරයේ සමාජ වගකීම් ඉටු කරන්නට පෙළඹෙන්නට විය. ජාතික තරුණ සේවා සභාවේ සංවර්ධන වැඩසටහන් සීමා කිරීමට සිදුවුණ යුගයක විවිධ කෘෂි නිෂ්පාදන වල

නියැලෙමින් තරුණ තරුණියන් තම ජීවන මට්ටම ඉහළ නංවා ගැනීමට පෙළඹෙන්නට විය. තොරතුරු තාක්ෂණය හා නවීන උපක්‍රමයන් භාවිතා කරමින් අලුතින් හිතන තාරුණ්‍යයේ රැල්ලක් රට පුරා බිහි විය. තරුණ තරුණියන් සුහුරු ගොවිපල ක්‍රමයට නැඹුරු වීම තුළින් ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට තාරුණ්‍යය පෙළඹෙනු ලැබීය.



ජාතික තරුණ සේවා සභාව සතු ප්‍රධාන ගොවිපලවල් 11 ක් ද, පුහුණු මධ්‍යස්ථාන 6ක් ආශ්‍රිතව හා සංවර්ධනය වෙමින් පවතින ගොවිපළ 02ක් ද විය. ගොවිපොළවල් 14 ක් ආශ්‍රිතව කෘෂි පාඨමාලා 23ක් 516ක තරුණ සහභාගීත්වයකින් පවත්වන ලදි.

- **සුහුරු ගෙවත්ත** සංකල්පය මගින් තරුණ තරුණියන් කෘෂි වගාව සඳහා දිරිගැන්වීමත් සමඟ තරුණ තරුණියන් 19,061ක් ලියාපදිංචි වී ඇත. තරඟ අංශ 04ක් යටතේ දිස්ත්‍රික් හා ජාතික වශයෙන් තරඟ පවත්වා තරුණයන් දිරිගන්වන ලදි.





4.9 සැළසුම්, ප්‍රගති සමාලෝචන හා නිළධාරී පුහුණු

සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්තියට අනුකූලව, තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම තුළින් රටේ තරුණයේ අවශ්‍යතාවයට අනුව ආයතනික කටයුතු විධිමත්ව සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සඳහා මග පෙන්වීම තුළින් ආයතනික කාර්යසාධනය විධිමත්ව ඉහළ නැංවීම.

සංයුක්ත සැළැස්ම සකස් කිරීම, වාර්ෂික සංවර්ධන සැළැස්ම , වාර්ෂික ක්‍රියාත්මක සැළැස්ම හා දිස්ත්‍රික් සැළැස්ම සකස් කිරීම ප්‍රධාන වශයෙන් සිදු වේ. පුස්තකාල සංවර්ධනය කටයුතු මෙන්ම ප්‍රගතිය (සති,මාසික හා කාර්තු) නියාමනය කිරීම සිදු වේ. තවද, ප්‍රගතිය මැන බැලීමෙන් අනතුරුව ආයතනික කාර්යසාධනය හා වාර්ෂික වාර්තා සකස් කිරීම සිදු කරයි.

- 2015, 2016, 2017 හා 2018 වාර්ෂික වාර්තාවන් පාර්ලිමේන්තු සභාගත කිරීම මෙම වර්ෂයේදී සිදු කරනු ලැබීය.

එමෙන්ම, ආයතනික නිළධාරී කාර්ය සාධනය ඉහළ නැංවීම උදෙසා ඔවුන්ගේ අවශ්‍යතාවය මත පුහුණු වැඩසටහන් 09 ක් සමාජ දුරස්ථභාවය තබා ගනිමින් නිලධාරීන් 446ක ගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කිරීමට හැකි විම.



4.10 මාධ්‍ය අංශය

ජාතික තරුණ සේවා සභාව මගින් සිදු කරනු ලබන තරුණ සංවර්ධන වැඩසටහන් පිළිබඳ මාධ්‍ය දැනුවත් කිරීම හා මාධ්‍ය මඟින් පුළුල් ප්‍රචාරයක් ලබා දීම. ජාතික තරුණ සේවා සභාව සිදු කරනු ලබන තරුණ සංවර්ධන වැඩසටහන් වලට අදාළව පුවත්පත් දැන්වීම් සකස් කිරීම හා පල කරවීම ගුවන් විදුලි හා රූපවාහිනී දැන්වීම් විකාශය කරවීම. විදුලි ආලෝක පුවරුව(ලයිට් බෝඩ්) සඳහා මාධ්‍ය කලා නිර්මාණය කිරීම හා අවශ්‍යතාවය අනුව ඒ ඒ අංශ මඟින් සිදු කරනු ලබන වැඩසටහන් වලට මාධ්‍ය කලා නිර්මාණ සිදු කර දීම හා සමරු කලාප නිර්මාණය කිරීම. ජාතික තරුණ සේවා සභාව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සියලුම තරුණ සංවර්ධන වැඩසටහන් වලට අදාළව අවශ්‍යතාවය අනුව අත් පත්‍රිකා, පෝස්ටර්, කටවුට් ආදියෙහි මාධ්‍ය කලා නිර්මාණ සිදු කිරීම යනාදිය මෙමඟින් සිදු වේ. තරුණ සංවර්ධන වැඩසටහන් සම්බන්ධ රූපවාහිනී දැන්වීම් 113ක් ද ගුවන් විදුලි දැන්වීම් 119ක්ද පුවත්පත් දැන්වීම් 124ක්ද පළ කරන ලදි.

4.11 තොරතුරු තාක්ෂණ ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාවේ සියලුම තොරතුරු තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම මෙමඟින් සිදු වේග එම අවශ්‍යතා අතර,

01. ජාතික තරුණ සේවා සභාවේ ක්‍රියාකාරකම් නවීන තාක්ෂණය භාවිතා කර ඉටු කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණික පහසුකම් සංවර්ධනය කිරීම.
02. කාර්යක්ෂම සන්නිවේදන ක්‍රමවේදයක් සැකසීම මගින් ශ්‍රී ලාංකීය තරුණ්‍යය වෙත තොරතුරු සන්නිවේදනය කාර්යක්ෂම කිරීම.
03. ජාතික තරුණ සේවා සභාවේ නිල වෙබ් අඩවිය සංවර්ධනය හා යාවත්කාලීන කිරීම තුලින් තොරතුරු ඉක්මනින් ලබා දීම.
04. ජාතික තරුණ සේවා සභාවේ පවතින පරිගණක ජාල පද්ධතිය නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.
05. ජාතික තරුණ සේවා සභාවේ යෞවන සමාජ /පුහුණු මධ්‍යස්ථාන තරුණ තරුණියන්ගේ තොරතුරු තාක්ෂණ භාවිතය හා ආරක්ෂාව පිළිබඳව දැනුවත් කිරීමේ වැඩමුළු සංවිධානය හා ක්‍රියාත්මක කිරීම.

1. Youth I_Club Membership drive.

- සියලුම පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය කරමින් යෞවන සමාජ තුල සිටින තරුණ තරුණියන් විසින් සිදු කරන ලබන ස්වේච්ඡා සේවාවන් හා ක්‍රියාකාරකම් ඇතුලත් නිවැරදි දත්ත පද්ධතියක් සැකසීම මෙමඟින් සිදු වේ.



2. Vehicle Request System.

- ජාතික තරුණ සේවා සභාවේ ආයතනය සතු වාහන රාජකාරි ගමන් සඳහා මාර්ගගත ක්‍රමය ඔස්සේ පහසුවෙන් වෙන් කරවා ගත හැකි වන පරිදි තොරතුරු පද්ධතියක් සැකසීම.

3. YSO Evaluation System.

- ජාතික තරුණ සේවා සභාව තුල සේවයෙහි නියුතු තරුණ සේවා නිලධාරීන් මගින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සඳහා කාර්‍ය සාධන ඇගයීමක් සිදු කිරීම.

4. Jayagamu Project.

- වෘත්තීය මාර්ගෝපදේශනය හා මාර්ග උපදේශනය යන ව්‍යාපෘති සිදු කිරීමට අවශ්‍ය මෘදුකාංගයක් නිර්මාණය කිරීම හා පරිපාලනය සිදු කිරීමට යටිතල පහසුකම් සැපයීම.

4.12 විභාග හා ඇගයීම්

❖ ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථාන 54 ක පවත්වනු ලබන NVQ සහ Non NVQ පාඨමාලා පවත්වන අතර, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් පිලිගත හැකි සහතිකපත් තරුණයන් හට ප්‍රදානය කිරීම මෙමඟින් සිදු වේ. තවද NVQ Online ක්‍රමවේදය පිළිබඳ දැනුවත් කිරීම පළාත් මට්ටමින් සිදු කරන ලදි.



2119 ක් සඳහා සහතික පත් නිකුත් කිරීම ද , 2200 සඳහා අවසන් ඇඟයීම් කටයුතු ද සිදු කර ඇත. ඊට අමතරව සෞන්දර්ය නිකේතන පාඨමාලා හදාරනු ලැබූ සිසුන් 112 හා නිස්කෝ විඩියෝ පාඨමාලාව සඳහා සහතික පත් 29 ක් ද නිකුත් කර ඇත.



4.13 විශේෂ ව්‍යාපෘති

ජාතික තරුණ සේවා සභාව අවස්ථානුකූලව සංවිධානය කරන ලද ව්‍යාපෘති සැළසුම් කිරීම/ සංවිධානය කිරීම හා ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදු වේ.



- විශේෂයෙන්ම දේශපාලන තිරණ ගැනීම, ප්‍රතිපත්ති සැකසීම වැනි දෑ සඳහා තරුණ තරුණියන්ගේ ඉහළ සහභාගීත්වයක් ඇති කිරීම උදෙසා නවීන තාක්ෂණය උපයෝගී කරගෙන තරුණ පාර්ලිමේන්තුව සඳහා මන්ත්‍රී මණ්ඩලය 2020 වර්ෂයේදී තෝරා ගත් අතර ඔවුන් සඳහා වැඩසටහන් පැවැත්වීම 2021 වර්ෂය තුළ සිදු කරන ලදි. මෙහිදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සහභාගීකයන් 331ක් ද විශ්ව විද්‍යාල මට්ටමින් සහභාගිකයින් 29ක්ද ඇතුළත් කරමින් 360 දෙනෙකු තෝරා ගන්නා ලදි.



- 2021 මාර්තු මස 01 හා 02 දිනයන්හිදී මහරගම තරුණ සේවා පරිශ්‍රය තුළ යොවුන් පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 307කගේ සහභාගීත්වයෙන් මංගල සැසිවාරය පවත්වන ලදි. ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තුවේ නියෝජිතයන්ගේ දැනුම, ආකල්ප හා කුසලතා සංවර්ධනය කිරීම උදෙසා 2021.10.15 දින සිට 23 දක්වා පුහුණු වැඩසටහනක් තුල්හිරිය මාර්ස් ෆැබ්රික් පාර්ක් ආයතනයේදී පවත්වන ලදි.



- තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ප්‍රජා සංවර්ධනය පිළිබඳ දැනුම හා අවබෝධය ලබා දීම සඳහා ලෝක සෞඛ්‍ය (WHO) සංවිධානය සමඟ එක්ව 2021.12.13 දින සිට 20 දින දක්වා තුල්හිරිය මාර්ස් ෆැබ්රික් පාර්ක් ආයතන පරිශ්‍රයේදී වැඩමුළුවක් පවත්වන ලදි.

- ජාතික රුධිර පාරවිලයන මධ්‍යස්ථානය හා එක්ව සියලුම දිස්ත්‍රික් වල තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ ප්‍රමුඛත්වයෙන් ලේ දන්දීමේ දීපව්‍යාප්ත කඳවුරු (BLOOD 4 HOPE) පවත්වන ලදි.



- රට පුරා විසිරී සිටින තරුණ තරුණියන්ගේ නිවේදන, ගායන සහ වාදන දක්ෂතා එළිදැක්වීමට ක්‍රියාත්මක කරන ඩිජිටල් වේදිකාව ලෙස පරිණත නායකයින්ගේ අත්දැකීම් තරුණ තරුණියින් අතර බෙදා හැරීම සඳහා "Young පැදුර" වැඩසටහන් 17ක් ක්‍රියාත්මක කරන ලදි.





- සියළුම ආගම් නියෝජනය වන පරිදි ශ්‍රී ලංකේය තරුණ තරුණියන් පරිසරයට සංවේදී වීම ඉහළ නැංවීමේ අරමුණින් ජාතික වැඩසටහනක් ලෙස 2021.06.05 වන දින "සුරකිමු ගංඟා" ඉවුරු සංරක්ෂණ වැඩසටහන දිස්ත්‍රික්ක 18 ක් තුල ආරම්භ කෙරිණි

- ආසියානු පදනම (The Asia Foundation) මඟින් ශ්‍රී ලංකා තරුණ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පුහුණුකරුවන් වශයෙන් පුහුණු කිරීමේ වැඩසටහන (මාර්ගගත ක්‍රමය ඔස්සේ) වැඩසටහන් 03ක් යටතේ 2021.08.25 දින සිට 2021.11.17 දින දක්වා තරුණ මන්ත්‍රීවරු 60කගේ සහභාගීත්වයෙන් පවත්වන ලදි.

- ප්‍රතිපත්ති සම්පාදනයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකුගේ කාර්යභාරය යන මැයෙන් මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වූ වැඩසටහන Westminster Foundation for Democracy (WFD), United Kingdom මඟින් සහභාගිකයින් 30කගේ දායකත්වයෙන් සිදු කරන ලදි.

4.14 යෞවන නිළිණ ප්‍රදානය .

එංගලන්තයේ එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර නිළිණ පදනම මඟින් ආරම්භ කරන ලද එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර නිළිණ වැඩසටහන 1980 වර්ෂයේ සිට ශ්‍රී ලංකාවේ වයස අවුරුදු 13-24 ත් අතර තරුණ කණ්ඩායම උදෙසා හඳුන්වා දී ක්‍රියාත්මක කිරීම මෙමගින් සිදු වේ. ශිෂ්ට සමාජය රදාපවතින්නේ ඒ ඒ සාමාජිකයන්ගේ නිදහස, බුද්ධිය, වගකීම , චර්යා හා ප්‍රමිතීන් මතය යන විශ්වාසය මත ජාතික යෞවන නිළිණ ප්‍රදාන වැඩසටහනේ දර්ශනය පදනම් වී ඇත

2021වර්ෂයේ වැඩසටහන් 16ක් ක්‍රියාත්මක කර ඇති අතර ඒ සඳහා 563 ක සහභාගීත්වයක් පවතී. මේ අතර පුහුණු වැඩමුළු 06 ක් 196 ක ගේ සහභාගිත්වයෙන් සිදු කරනු ලැබේ.

4.15 ව්‍යවසායකත්ව සංවර්ධනය හා රැකියා උත්පාදනය,

ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාවගේ ආර්ථික අස්ථාවරත්වය අවම කිරීමට මඟ පෙන්වමින් ව්‍යවසායක සංස්කෘතියක් රටතුළ ගොඩනැංවීමට පුරෝගාමීව කටයුතු කිරීම මෙහිදී ප්‍රධාන අරමුණ වේ. තරුණ ව්‍යවසායකයින්ට සේවා සැපයීම සඳහා තරුණ සමුපකාර ජාලය ගුණාත්මක, ප්‍රමාණාත්මක හා තිරසාර ලෙස සංවර්ධනය කිරීම ද මෙමඟින් සිදුවේ.

තරුණ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය කිරීම උදෙසා වැඩමුළු 38ක් තරුණ තරුණියන් 1252 කගේ සහභාගීත්වයෙන් ක්‍රියාත්මක කරන ලදි. සෞභාග්‍යමත් තරුණ ව්‍යවසායකයා යටතේ 1232ක් තෝරා ගන්නා ලදි. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් ඒ ඒ දිස්ත්‍රික්කයට ආවේණික ක්‍රමවේදයන් භාවිතා කර තෝරා ගැනීම සිදු කිරීම. පුහුණුකරුවන් ලෙස නිළධාරින් 90 ක් පුහුණු කළ ඇති අතර තරුණයන් 09 දෙනෙකු සඳහා ණය පහසුකම් ලබා ගැනීමට අවස්ථා උදා කර දී ඇත.

5.පාලන අංශයේ ක්‍රියාකාරකම්

5.1.ආයතනික කටයුතු.

1979 අංක 69 දරණ ජාතික තරුණ සේවා පනත යටතේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය වන සේවක සංඛ්‍යාව බඳවා ගැනීම හා පරිපාලනමය සංවර්ධනය ඇති කිරීම මෙමඟින් සිදු කරයි. එහෙත් ස්ථාන මාරුවීම්, විනයානුකූල නියෝග අනුව සේවයෙන් පහකිරීම්, ධුරය අතහැර යෑම්, වැටුප් හා වේතනයන්, සේවයෙන් විශ්‍රාම ගැන්වීම් හා සේවයෙන් ඉල්ලා අස්වීමද පුර්ණ වර්ෂවලදි කටයුතු කර ඇති ආකාරයෙන්ම සිදුවි ඇත. 2021 වසර තුළ ආයතනය පරිපාලනමය ලෙස වෙනස් කම් කිහිපයකට භාජනය විය.



5.2 ප්‍රසම්පාදන කටයුතු

ප්‍රසම්පාදන අංශය ප්‍රධාන වශයෙන් කරනු ලබන්නේ ප්‍රධාන කාර්යාලය, පළාත් කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල, පුහුණු මධ්‍යස්ථාන යන මේවායේ ඇති වන අවශ්‍යතා (සේවා හා භාණ්ඩ වශයෙන්) විධිමත් අනුමැතියක් සමඟ කරනු ලබන ඉල්ලීමෙන් පසු ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කරමින් එම කාර්යයන් ඉටු කිරීමයි.

2021 වර්ෂයේදී ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන කාර්යාලය මඟින්, අනෙකුත් කාර්යාල මඟින් හා පුහුණු මධ්‍යස්ථාන මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සඳහා භාණ්ඩ හා සේවා සපයමින් කටයුතු කර ඇත.

5.3 ප්‍රවාහන කටයුතු

ජාතික තරුණ සේවා සභාවේ අරමුණු හා පරමාර්ථ ඉටු කිරීම සඳහා විවිධ අංශ මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් වලදී ප්‍රධානතම සහාය සේවාවක් වශයෙන් ප්‍රවාහන සේවා සැපයීම මෙමඟින් සිදු වේ

5.4 අභ්‍යන්තර විගණක කටයුතු

ජාතික තරුණ සේවා සභාවට අදාළව විගණකාධිපති විසින් අනුමත කර ඇති විගණන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා සභාපතිතුමාගේ උපදෙස් මත කෙරෙන විමර්ශන හා වෙනත් විශේෂ රාජකාරී ඉටුකිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

5.5 ලේකම් කාර්යාලය හා සම්බන්ධ කටයුතු

ලේකම් අංශය මඟින් ජාතික තරුණ සේවා සභාවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සංවිධානය කිරීම, පවත්වාගෙන යාම, එහිදී ගනු ලබන තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ අංශ සහ අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් වෙත බෙදා දීම සිදු කරනු ලබයි. ඊට අමතරව ජාතික තරුණ සේවා සභාවේ වෙනත් වැඩසටහන් වලට අදාලව අවස්ථානුකූලව පවරනු ලබන රාජකාරී කටයුතු ද ඉටු කරනු ලැබේ.

5.6 නීති විමර්ශන ක්‍රියාකාරකම්.

ජාතික තරුණ සේවා සභාව විසින් පවරා ඇති නඩු සම්බන්ධව හා මෙම සභාවට එරෙහිව පවරා ඇති නඩු පිළිබඳව මෙම සභාව වෙනුවෙන් හා/හෝ සභාපති අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට පෙනි සිටීම හා කරුණු ඉදිරිපත් කිරීම ද , අවශ්‍යතාවය අනුව නීතිපති දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය කිරීම ආදී කටයුතු නීති විමර්ශන අංශය මඟින් සිදුකෙරේ.

5.7 ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරකම්.

ඉදිකිරීම් / නඩත්තු අංශය මඟින්, දිවයින පුරා පවතින සියළුම පළාත් කාර්යාල , දිස්ත්‍රික් කාර්යාල හා තරුණ මධ්‍යස්ථාන වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම හා වෘත්තීය පුහුණුවට අදාළ ගොඩනැගිලි ඉදිකිරීම් හා නවීකරණය කරන අතර තරුණ මධ්‍යස්ථාන දෛනික නඩත්තු කටයුතු සහ මධ්‍යස්ථාන නවීකරණය හා අලුත්වැඩියා කටයුතු ඉටුකරනු ලබයි.

ඒ අනුව 2021 වර්ෂයේ ව්‍යාපෘති 02ක් සම්පූර්ණයෙන් අවසන් කර අදාළ මධ්‍යස්ථානවෙත භාර දී ඇති අතර අනෙකුත් ව්‍යාපෘති 2022 වර්ෂයේදී අවසන් වීමට අපේක්ෂිතය. මේ දක්වා වැඩ තත්ත්වය පහත පරිදි විය.

අනු අංකය	ව්‍යාපෘතිය	භෞතික ප්‍රගතිය %
01	බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය - අදියර 11	22%
02	බෙල්වුඩ් පුහුණු මධ්‍යස්ථානය නවීකරණය - අදියර 1	70%
03	නුවරඑළිය සංචාරක බංගලාව ඉදිකිරීම	95%
04	මහරගම තරුණ මධ්‍යස්ථානය ගබඩාව හා රියදුරු නේවාසිකාගාරය ඉදිකිරීම.	100%
05	පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම	98%
06	හලාවත පුහුණු මධ්‍යස්ථානය ප්‍රතිසංස්කරණය කිරීම අවසන් අදියර	60%
07	මහරගම තරුණ මධ්‍යස්ථානය පිහිනුම් තටාකය ඉදිකිරීම	100%
08	මොණරාගල පුහුණු මධ්‍යස්ථානය නවීකරණය	60%

5.8 තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා 2021 වසර තුළ දරන ලද ප්‍රයත්නයන්

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සෞඛ්‍ය සම්පන්න ජීවිත සුරක්ෂිත කිරීම සහ සෑම වයස් කණ්ඩායමක් සඳහාම, ශරීර සුවතාව වර්ධනය කිරීම	2030 වන විට බෝ නොවන රෝග නිසා සිදුවන අකල් මරණ, ප්‍රතිකාර මගින් හා වලක්වා ගැනීමේ ක්‍රම මගින් තුනෙන් එකකින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය සහ යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	ක්‍රීඩා වැඩසටහන් සඳහා සහභාගිවූ සහභාගිකයින්			√
පරිපූර්ණ, සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් සහතික කිරීම සහ සෑමට ජීවිත කාලය පුරා ඉගෙනීමේ අවස්ථා සැලසීම	2030 වන සුනිසි රැකියා සහ ව්‍යවසායකත්වයක් සඳහා තාක්ෂණික හා වෘත්තිය සුදුසුකම් ඇතුලුව අදාල කුසලතා ලබා සිටින තරුණයින් සහ වැඩිහිටියන්ගේ සංඛ්‍යාව සැලකිය යුතු මට්ටමින් ඉහළ නැංවීම	2020 වසරේ වෘත්තිය, ව්‍යවසායකත්ව පුහුණු ලබා ගත් තරුණ තරුණියන් සංඛ්‍යාව		√	

**අභියෝග - Covid 19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් තරුණ තරුණියන් ඒකරාශී කිරීම හා ජාත්‍යන්තර තරුණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම දැවැන්ත අභියෝගයක් විය.

6. ස්වේච්ඡා වැඩසටහන්.

ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වල සේවය කරන තරුණ සේවා නිලධාරීන් යෞවන සමාජ හා තරුණ පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන තරුණ තරුණියන් සමඟ ප්‍රාදේශීයව හා කාලීන අවශ්‍යතාවයන් අනුව ස්වේච්ඡාවෙන් හෝ ස්වේච්ඡාවෙන් සොයා ගත් ප්‍රතිපාදන මඟින් විවිධ වැඩසටහන් සංවිධානය කරන ලදී. විවිධ ක්ෂේත්‍රයන් ආශ්‍රිතව වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර, මෙම වැඩසටහන් තුළින් යෞවන සමාජවල සාමාජික සාමාජිකාවන් තුළ පමණක් නොව ප්‍රදේශවාසීන් හා යෞවන යෞවනියන් අතර අන්තර් සහජීවනය සමඟිය ඇති වේ .රටේ යම් හෝ සංවර්ධන කාර්යය සඳහා ස්වේච්ඡාවෙන් තරුණ පිරිස් යොදා ගැනීම මෙම ස්වේච්ඡා වැඩසටහන් තුළින් සිදුකෙරේ.

2021 වසරේ වාර්තා වූ ස්වේච්ඡා වැඩසටහන් 2 194 ක් වූ අතර, 175 343 ක තරුණ පිරිසක් සහභාගිව ඇත. ඔවුන්ගේ ස්වේච්ඡා සේවය සඳහා ලබා දුන් මුල්‍යමය වටිනාකම රුපියල් 32 403 727.00 ක් ලෙස සඳහන් කළ හැක.

දිස්ත්‍රික්කය	මුළු වැඩසටහන් සංඛ්‍යාව	මුළු සහභාගිත්වය	අපේක්ෂා කරන ලද මුළු වටිනාකම
කොළඹ	112	5770	1,918,400.00
ගම්පහ	120	4706	110,350.00
කළුතර	130	6700	3,410,000.00
ගාල්ල	138	9338	460,800.00
මාතර	180	8103	3,302,800.00
හම්බන්තොට	174	3209	175,800.00
මහනුවර	13	574	9,000.00
මාතලේ	56	38005	776,000.00
නුවරඑළිය	38	10724	1,893,000.00
රත්නපුරය	135	1380	783,000.00
කෑගල්ල	68	1346	490,500.00
බදුල්ල	35	851	2,416,500.00
මොණරාගල	77	2959	1,358,700.00
පොළොන්නරුව	49	1054	117,360.00
අනුරාධපුර	65	3715	975,000.00
ත්‍රිකුණාමලය	22	780	122,400.00
අම්පාර	112	2213	8,950.00
මඩකලපුව	129	1980	420,600.00
කුරුණෑගල	322	64968	11,052,870.00
පුත්තලම	94	4562	1,048,150.00
යාපනය	26	999	350,500.00
වව්නියාව	68	2016	495,320.00
මන්නාරම	20	428	36,050.00
මුලතිව්	18	946	175,177.00
කිලිනොච්චි	70	976	496,500.00
	2194	175,343	32,403,727

***පාරිසරික/ සෞඛ්‍ය හා සනිපාරක්ෂක සේවා/ ක්‍රීඩා සංවර්ධන/ අධ්‍යාපනික/නායකත්ව කුසලතා / වෘත්තිය මාර්ගෝපදේශන යනාදි ස්වෙච්ඡා වැඩසටහන්

7. කාර්යසාධන වාර්තාව - 2021

අ.ආයතනයේ කාර්ය සාධනය

1. ප්‍රතිපාදන සැලසීම

2021 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ සමස්ත ලැබීම් වලින් රු. මි.1,709,462 ක් මහා භාණ්ඩාගාරයෙන් ද අමාත්‍යාංශය හා රාජ්‍ය ආයතන හරහා රු.මි.144,714 ක් ද ලැබී ඇත. එයින් රු. මි. 1,303.56 ක් පුනරාවර්ථන වියදම් වශයෙන් හා රු.මි. 510,168 ක් ප්‍රාග්ධන වියදම් වශයෙන් වැයකර ඇත. එම වසරේ ජාතික තරුණ සේවා සභාව සිය අභ්‍යන්තර ආදායම් මාර්ගවලින් රු. මි. 155,363 ක් උපයාගෙන තිබේ.

2. සංවර්ධන වැඩසටහන්

ජාතික තරුණ සේවා සභාව 2021 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ සංවර්ධන වැඩසටහන් යටතේ තරුණ කුසලතා සංවර්ධනය සඳහා වූ දේශීය වැඩසටහන් 11258 ක් 529,124 ක තරුණ පිරිසකගේ සහභාගීත්වයෙන් පවත්වා ඇත. ඒ සඳහා වැයකර ඇති මුදල රු. මි. 249.18 කි. 2021 දී පැවැත්වූ තරුණ ක්‍රීඩා සංවර්ධන ක්‍රියාකාරකම් අතර 33 වැනි ජාතික යෞවන ක්‍රීඩා උළෙලට සමගාමීව ප්‍රාදේශිය මට්ටමේ තරඟ, දිස්ත්‍රික් තරඟ හා ජාතික මට්ටමේ තරඟ පවත්වා ඇති අතර එහිදී නව තරඟ වාර්තා 11ක් විය. තරුණ සේවා ක්‍රීඩා පුහුණු පාසල, තරුණ සේවා රූපවාහිනී වොලිබෝල් තරඟාවලිය මෙන්ම ග්‍රාමීය තරුණයන්ගේ සැඟවුණු දක්ෂතා හඳුනාගැනීමේ වැඩසටහන් රැසක් මෙන්ම සෞන්දර්ය කුසලතා සංවර්ධන ක්‍රියාකාරකම් අතර ජාතික යොවුන් චිත්‍රපට, නාට්‍ය හා සම්මාන තරඟාවලිය, නාට්‍ය හා රංගකලා ඩිප්ලෝමාව, ගම්දොරින් රඟමඩලට, නව නිර්මාණ එළි දැක්වීම හා නර්තන හා සංගීත කණ්ඩායම් මේ අතර ප්‍රධාන වේ. ඊට අමතරව ජාතික සංස්කෘතික වැඩසටහන් හා අමාවකට පහන් වැස්ස වැඩසටහන පැවැත්වීමට ද ජාතික තරුණ සේවා සභාව කටයුතු කර ඇත. මාර්ගස්ථ ක්‍රමවේද ඔස්සේ රාජකාරී කාර්යක්ෂම කිරීම සඳහා නව මෘදුකාංග පද්ධති නිර්මාණය සංවර්ධනය කිරීම මෙම වසර තුළ ක්‍රියාවට නංවන ලදි.

3. කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම්

කාර්මික හා වෘත්තීය පුහුණු ක්‍රියාකාරකම් යටතේ ජාතික තරුණ සේවා සභාව පුහුණු මධ්‍යස්ථාන 54කදී පැවැත්වූ පූර්ණකාලීන හා අර්ධකාලීන පුහුණු පාඨමාලා 81 ක් සඳහා බඳවාගත් සිසුන් සංඛ්‍යාව 15,653 ක් වන අතර එයින් සිසුන් 5,920 ක් NVQ මට්ටමේ පාඨමාලා අවසන් කර ඇත.

4. ව්‍යවසායකත්ව හා කෘෂි සංවර්ධනය

ජාතික ව්‍යවසායකත්ව හැකියාවන් වර්ධනය කිරීම අරමුණු කරගෙන ජාතික තරුණ සේවා සභාව වැඩසටහන් 38ක් 1252කගේ සහභාගීත්වයෙන් පවත්වා ඇති අතර ඒ සඳහා 2021 වසරේදී රු. මි. 6,688 ක් වැය කර ඇත. තවද ගොවිපල මධ්‍යස්ථාන 19 කදී කෘෂි පාඨමාලා 23ක් පවත්වා ඇති අතර තරුණ තරුණියන් 19,061ක ලියාපදිංචියෙන් “සුහුරු ගෙවත්ත” වැඩසටහනද දිවයින පුරා ක්‍රියාත්මක කරන ලදි.

5. ජාත්‍යන්තර තරුණ සබඳතා

තරුණ තරුණියන් 5ක් ජගත් තරුණ නෞකා වැඩසටහන සඳහා ද කලාපීය තරුණ සමුළු හා වැඩමුළු සඳහා තරුණ නියෝජිතයින් 114ක් ද සහභාගී වූ අතර විදේශ සංචිතය සඳහා තරුණ තරුණියන් 230 ක් ද තෝරාගන්නා ලදි. එඩින්බරෝ ආදිපාද ජාත්‍යන්තර තිළිණ හා සමගාමී වැඩසටහන් 16ක් තරුණ තරුණියන් 563කගේ සහභාගීත්වයකින් ක්‍රියාත්මක කරන ලදි.

6. කාර්ය මණ්ඩල කටයුතු හා සංවර්ධනය

වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ කාර්ය මණ්ඩලයට නිලධාරීන් 13 ක් කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇත. 2021 වර්ෂය තුළ නිලධාරීන් 446 ක් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් 18 ක් පැවැත්වීමට කටයුතු කර ඇත.

7. ඉදිකිරීම් කටයුතු

2021 වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන රු. මි. 98.38ක් යොදවා ඉදිකිරීම් හා නවීකරණ ව්‍යාපෘති 08ක් ක්‍රියාත්මක කරන ලදි. මෙයින් ව්‍යාපෘති 02ක් වැඩ අවසන් කර ඇති අතර ව්‍යාපෘති 05ක්, 50% ඉක්මවා වැඩ අවසන් කර ඇත.

ආ. කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

ආයතනයේ කාර්යසාධනය වර්ධනය කර ගැනීම සඳහා ඉදිරියේදී අනුගමනය කිරීමට අපේක්ෂිත කෙටිකාලීන හා මධ්‍යකාලීන ක්‍රියාමාර්ග පහත පරිදි වේ.

කෙටි කාලීන ක්‍රියාමාර්ග

1. "සෞභාග්‍යයේ දැක්ම" ජාතික ප්‍රතිපත්තිය මෙන්ම තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයට අදාළ සුවිශේෂී ප්‍රමුඛතා ප්‍රකාරව කාලීන තරුණ අවශ්‍යතාවයට ගැලපෙන පරිදි වැඩසටහන් නිර්මාණය කර ක්‍රියාත්මක කිරීම.
2. තරුණ ප්‍රජාව තුළ ව්‍යාපාරික අවස්ථාවන් ප්‍රවර්ධනය කිරීම.
3. කාලීනව රටේ පැවැති අවස්ථාවන්ට අනුකූල වන පරිදි තරුණ ප්‍රජාව කෘෂිකර්මාන්තය හා දේශීය වගාවන් සඳහා යොමු කිරීම.
4. ආදර්ශමත් ගොවිපලවල් සංවර්ධනය තුළින් තරුණ ආර්ථිකය සවිබල ගැන්වීමට දායකත්වය ලබා දීම.
5. නවීන තාක්ෂණික උපායමාර්ග ඔස්සේ යාවත්කාලීන පුහුණු ලබා දීම තුළින් වෙළෙඳපොළ ඉල්ලුම් කරන තරුණයන් බිහි කිරීම.
6. වෘත්තීය මාර්ගෝපදේශනය ලබා දීම තුළින් තරුණ මානසික ආකල්ප වර්ධනය කිරීම.
7. තාරුණ්‍යය තුළ ස්වේච්ඡා සේවය පිළිබඳ යහපත් මානසික හැඟීම් වර්ධනය කිරීම.
8. තරුණයන් තුළ පවත්නා ක්‍රීඩා සෞන්දර්ය, මාධ්‍ය, සිනමා හා ක්‍රියාකාරකම් එළි දැක්වීමට අවශ්‍ය පරිසරයක් නිර්මාණය කිරීම.
9. තරුණ අදහස් දැක්වීමට හා ඔවුන්ගේ ගැටලු සාකච්ඡා කිරීමට වේදිකාවක් නිර්මාණය කිරීම.
10. රාජ්‍ය, රාජ්‍ය නොවන, දේශීය හා විදේශීය ආයතන සමඟ එක් වී කටයුතු කිරීම හා පවත්නා වසංගත තත්වය හමුවේ පීඩිත තරුණයන්ට අස්වැසිල්ලක් ලබා ගැනීමට පහසුකම් සැලසීම.

මධ්‍ය කාලීන ක්‍රියාමාර්ග

1. දේශීය හා විදේශීය ව්‍යාපාරික අවස්ථා තරුණ තරුණයන්ට හඳුන්වාදීම හා ඒ සඳහා පහසුකම් සැපයීම.
2. ව්‍යාපාරික අවස්ථා සඳහා නව තාක්ෂණික උපකරණ පහසුකම් සපයන තාක්ෂණික පද්ධති වර්ධනය කිරීම.
3. සියලුම ශ්‍රී ලාංකීය තාරුණ්‍යය එකම ජාලයක් මත සංවිධානගත කිරීම හා ඔවුනට පිළිගැනීමක් ඇති කිරීම.
4. කාලීනව රටේ පවතින තත්වයට හා දේශලාපාලනයට සංවේදී, විෂය දැනුමෙන් පෝෂිත, දේශපාලන භූමිකාවක් නිර්මාණය කිරීමට අවශ්‍ය පරිදි තාරුණ්‍යය මෙහෙයවීම හා සතුටින් ජීවත් විය හැකි පවුලක් නිර්මාණය කිරීම.
5. කාලීන අවශ්‍යතා අනුව, තාක්ෂණික ක්‍රමවේද ආයතනය තුළ නිර්මාණය කිරීම.
6. තරුණ තරුණියන්ට පහසුකම් වලින් හෙබි තරුණ මධ්‍යස්ථාන පරිශ්‍රයන් දිවයින් පුරා නිර්මාණය කිරීම.
7. ආයතනික දැක්ම අනුව උපායමාර්ග සැලසුම් කිරීම, මානව සම්පත සංවර්ධනය කිරීම.
8. කාර්යමණ්ඩල කාර්යක්ෂමතාවය උදෙසා ඇගයීම්, පුහුණු ලබා දීම තුළින් මානසික අසමතුලිතතාවය හා අවිනිශ්චිතභාවයන් අවම කිරීම.

8. 2021 වර්ෂයට අදාළ විගණන විමසුම් මඟින් දක්වා ඇති කරුණු නිවැරදි කිරීමට ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව.

විගණන විමසුම් අංකය	විගණන විමසුම හා එමගින් පෙන්වා දී ඇති කරුණු	නිවැරදි කිරීමට ගනු ලැබූ හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග
VTY/A/NYSC/ 2020/AQ/04 2021.01.06	ඉදිකිරීම් කර්මාන්තවලට අදාලව සුරක්ෂණ බැඳුම්කර හා රක්ෂණාවරණ සඳහා ගෙවීම් කිරීම පිළිබඳ පරීක්ෂාව.	මෙම ව්‍යාපෘතින්ට අදාල ප්‍රමාණ පත්‍ර සැකසීමට SLS 573 Method of Measurement හි සම්මත ක්‍රමවේද අනුගමනය කර ඇති අතර, ඒ අනුව වැඩ කාර්යයන් මැනිම "Item" ලෙස සිදුකර ඇත.
VTY/A/NYSC/ 2020/AQ/04 2021.08.03	ඉදිකිරීම් කර්මාන්තවලට අදාලව සුරක්ෂණ බැඳුම්කර හා රක්ෂණාවරණ සඳහා ගෙවීම් කිරීම පිළිබඳ පරීක්ෂාව.	කොන්ත්‍රාත්කරු දරන සත්‍ය පිරිවැය තහවුරු කර ගැනීමේ දී මින් ඉදිරියට වඩා සැලකිලිමත්වීමට උපදේශක ආයතනයට දැනුම් දීමට කටයුතු කර ඇත.
VTY/A/NYSC/ 2020/AQ/05	ඉදිකිරීම් කර්මාන්තවලට අදාලව සුරක්ෂණ බැඳුම්කර හා රක්ෂණාවරණ සඳහා ගෙවීම් කිරීම පිළිබඳ පරීක්ෂාව.	දඹුල්ල තාක්ෂණික පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම,සපුගස්කන්ද පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම අදියර 1, අනුරාධපුර යොවුන් නිකේතනයේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම යන ව්‍යාපෘති තුනේද වැඩකාර්යය සඳහා ලංසුකරුවන් "Item" ලෙස ලංසු තබා ඇති හෙයින්, A සංකේතය මුද්‍රණය වී තිබුණද A ආකාරයට (කාර්යයට වැයදැරූ සත්‍ය වියදම+5%) ගෙවීම් කිරීමට ගිවිසුම් ප්‍රකාරව නොහැක.
VTY/A/NYSC/ 2020/AQ/06	ඉදිකිරීම් සම්බන්ධ ප්‍රගතිය පරීක්ෂාව	**නුවරඑළිය සංචාරක බංගලාව ඉදිකිරීම-** වර්ථමානයේ මධ්‍යස්ථ ප්‍රගතියකින් යුතුව කාර්යය ඉටුවෙමින් පවතින අතර, ප්‍රගතිය 50% ඉක්මවා ඇත. **හලාවත පුහුණු මධ්‍යස්ථානයේ ඉතිරි වැඩ නිමකිරීම-** කොන්ත්‍රාත් ආයතනය විසින් ගිවිසුම් ප්‍රකාරව කාර්යය ඉටුකිරීම තවකාලිකව නතර තර ඇත. උපදේශක හා කොන්ත්‍රාත් ආයතන ගෙන්වා අධ්‍යක්ෂ ජනරාල් සමඟ සාකච්ඡා පැවැත්වීමට කටයුතු යොදා ඇත. **බෙල්වුඩ් පු.ම. නවීකරණය අදියර 1-** මේ වන විට 70% ප්‍රගතියක් ලබා කාර්යය ඉටුකරමින් පවතී.

		බෙල්වුඩ් පු.ම. නවීකරණය අදියර 11- මේ වන වට 15% ප්‍රගතියක් ලබා කාර්යය ඉටුකරමින් පවතී. **පොල්ගොල්ල පුහුණු ගොඩනැගිල්ල ඉදිකිරීම-** මේ වන වට 60% ප්‍රගතියක් ලබා කාර්යය ඉටුකරමින් පවතී. **ගබඩාව රියදුරු කාමර ගොඩනැගිල්ල ඉදිකිරීම-** සම්පූර්ණයෙන් ඉදිකිරීම් අවසන් කර ඇති නමුත් හඳුනාගත් වැරදි(Defects) නිවැරදි කරමින් පවතී. **මොණරාගල පු.ම.-** මේ වන වට 52% ප්‍රගතියක් ලබා කාර්යය ඉටුකරමින් පවතී. මීට අමතරව Covid – 19 ව්‍යාප්තිය ,අධික වර්ෂාව හා බිල්පත් නොගෙවීම හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාදවීම සිදුවී ඇත.
VTY/A/NYSC/ 2020/AQ/07	ගම්පහ දිස්ත්‍රික් කාර්යාල ගොඩනැගිල්ල අළුත්වැඩියාව හා වර්ණාලේප කිරීම පිළිබඳ පරීක්ෂාව.	මේ සම්බන්ධව මූලික විමර්ශනය අවසන් කර ඇති අතර,ඉදිරි විනය ක්‍රියාමාර්ග ගැනීමට පියවර ගැනේ.
VTY/A/NYSC/ 2020/AQ/08	ජාතික තරුණ සේවා සභාවේ තරුණ මධ්‍යස්ථානයේ පිහිනුම් තටාකය ඉදිකිරීම් පරීක්ෂාව	උපදේශන ආයතනයේ වෘත්තීය නිපුණත්වය අඩුපාඩු සලකා බලා සම්පූර්ණ කළ අදියර දක්වා ගෙවීම් කිරීමට සේවාව අවසන් කිරීමේ අවබෝධතා ගිවිසුමකට යටත්ව කටයුතු කර ඇත. බිලපත් ගෙවීමට නොහැකිවීම,අධික වර්ෂාව ගලවා ඉවත්කිරීම ප්‍රමාදවීම සැලසුම් වල පැවති අඩුපාඩු නිවැරදි කිරීම යන නොවැළැක්විය හැකි හේතු නිසා ඉදිරිකිරීම් ප්‍රමාද විය. වරින්වර ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වුවද සංශෝධිත අවසන් විය යුතු දිනය වන 2019.12.10 දින කාර්යය සාර්ථකව අවසන් කර ඇත.
VTY/A/NYSC/ 2020/AQ/09	ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද Start-up Sri Lanka වැඩසටහන පිළිබඳ පරීක්ෂාව	මේ සම්බන්ධව මූලික විමර්ශනයක් සිදුකිරීමෙන් අනතුරුව අදාල නිළධාරීන්ගෙන් හේතු විමසා අදාල අලාභ අයකර ගැනීම සඳහා පියවර ගෙන ඇත.

VTY/A/NYSC/ 2020/AQ/10	2020 වර්ෂයේ මූල්‍ය හා මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ පරීක්ෂාව.	උඟව පළාත් කාර්යාලය හා බදුල්ල දිස්ත්‍රික් කාර්යාල පිහිටා ඇති ඉඩම් සම්බන්ධ තක්සේරු වාර්තාව ලැබී ඇති අතර, වටිනාකම 2021 වර්ෂයේ ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත. අනෙකුත් ඉඩම් සම්බන්ධ තක්සේරු වාර්තා 2021 වර්ෂය තුල ලබාගෙන ගිණුම්ගත කරන ලෙස නිළධාරීන්ට උපදෙස් ලබා දී ඇත. සභාව විසින් භුක්ති විඳින ඉඩම් 40 සම්බන්ධ රජයේ පවත්නා නීතිරීති වලට අනුකූලව පවරා ගැනීම් කටයුතු කඩිනමින් අඛන්ඩව සිදුකෙරේ.
VTY/A/NYSC/ 2020/AQ/11	මූල්‍ය ප්‍රකාශන විගණනය - 2020.	සී/ස තරුණ සේවා සමාගමට ගෙවිය යුතු ආරක්ෂක වියදම් වටිනාකම ගිණුම් සකස් කරන අවස්ථාව වන විට නිශ්චිතව හඳුනා ගැනීමට නොහැකි වූ බැවින් උපචිත වියදම් ගිණුම්ගත කිරීමට නොහැකි වූ අතර, ඉදිරියේදී මෙම වියදම් කල්වේලා ඇතිව හඳුනාගෙන උපචිත වියදම් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කෙරේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 07 අනුව වත්කම් ප්‍රත්‍යාගණනය කර ඉදිරියේ දී දළ ධාරණ අගය හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. වෙනත් මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති කෙරීගෙන යන වැඩවල වටිනාකම 2021 වර්ෂයේදී ජංගම නොවන වත්කම් යටතේ පෙන්වීමට කටයුතු කරනු ඇත.
VTY/A/NYSC/ 2020/AQ/13	ජාතික තරුණ සේවා සභාවේ 2020 දෙසැම්බර් 31 දින වන විට සේවක කළමනාකරණය පිළිබඳව සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු සම්බන්ධවයි.	රාජකාරී ඉටුකිරීමේ පදනම මත තනතුරු ලබාදී ඇති නිළධාරීන් 21 ස්ථිර කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී. වැඩබැලීමේ පදනම මත තනතුරු ලබාදී ඇති පුරප්පාඩු පිරවීමට 2021.04.19 දින සිංහල,දෙමළ, ඉංග්‍රීසි පුවත්පත්වල ගැසට් කර හා අභ්‍යන්තරවද අයදුම්පත් කැඳවා ඇත. ඊට අමතරව නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුරට අවශ්‍ය සුදුසුකම් සපුරාලන තෙක් උසස්වීම් ලබාදිය නොහැකි අතර, සුදුසුකම් සපුරාලීමෙන් අනතුරුව උසස්වීම් ලබාදීම සිදුකෙරේ. පුරප්පාඩු සියළු තනතුරු සඳහා අයදුම්පත් කැඳවා ඇති අතර, ඉදිරියේදී ස්ථිර පදනමින් පත්වීම් ලබාදීමට නියමිතය.
VTY/A/NYSC/ 2020/AQ/14	ආංශික නිපුණතා සංවර්ධන වැඩසටහනට අදාළව ජාතික තරුණ සේවා සභාවේ ගිණුම් පරීක්ෂාව - 2020	ඉදිරිපත් කරන ලද ගිණුම් ප්‍රකාශන සැකසීමේ දී පාරිතෝෂික වෙන් කිරීමේ වටිනාකම වූ රු.44,702,514.08 ඉවත්කර මුදලින් ගෙවූ වටිනාකම පමණක් ගිණුම් ප්‍රකාශනයේ නිවැරදිව දක්වා ඇත.

		වෙනත් පුනරාවර්තන වියදම් උපලේඛනය හා ව්‍යාපෘති ගිණුමේ වියදම් සැසඳීම් කර නිවැරදිව දැක්වීමට ඉදිරියේ දී කටයුතු කරනු ඇත. රු.96,482,373.91 ක වටිනාකම අභ්‍යන්තර ආදායමින් වර්ෂය තුල දරන ලද වියදම වේ. ඒ අනුව එම වටිනාකම නියමිත පරිදි අභ්‍යන්තර ආදායමින් දරණ ලද වියදම ලෙස, ඉදිරිපත් කරන ලද ගිණුම් ප්‍රකාශනයේ නිවැරදිව දක්වා ඇත.
VTY/A/NYSC/ 2020/AQ/15	නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහන මගින් ජාතික තරුණ සේවා සභාව සඳහා සිදුකළ කාර්යයන්හි ප්‍රගතිය	නිපුණතා ආංශික සංවර්ධන වැඩසටහනේ ආධාර හා ප්‍රදාන යටතේ පුහුණු මධ්‍යස්ථාන 10 ක් සංවර්ධනය කිරීම සඳහා යෝජනා වුවත් පුහුණු මධ්‍යමස්ථාන 06 ක් පමණක් සංවර්ධනය කිරීම සඳහා කටයුතු කරන ලද අතර, පුහුණු මධ්‍යස්ථාන දෙකකට අදාල කටයුතු නිමකර පරිහරණ කටයුතු සඳහා යොදාගෙන ඇත. ඉතිරි පුහුණු මධ්‍යස්ථායන්හි ඉදිකිරීම් කටයුතු නිමකිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම මත මේ වන විට ඉදිකිරීම් කටයුතු නිමකිරීමට නොහැකි වී ඇත. ජාතික තරුණ සේවා සභාව විසින් පවත්වාගෙන යනු ලබන මධ්‍යස්ථානයන්හි ක්‍රියාත්මක කරනු ලබන පුහුණු පාඨමාලාවන්හි ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව මගින් තත්ත්ව සහතික (QMS) පුහුණු මධ්‍යස්ථාන 16 ක් සඳහා ලබාගෙන ඇත. මීට අමතරව එක් මධ්‍යස්ථානයක් සඳහා (ISO) තත්ත්ව සහතිකයද ලබා ගෙන ඇති අතර, 2020 වර්ෂයේ සිට පුහුණු මධ්‍යස්ථාන 32 ක් සඳහා තත්ත්ව වර්ධක සහතික (QIS) ලබා ගැනීම සඳහා ඉලක්ක ලබාදී තිබූ අතර, මේ වන විට පුහුණු මධ්‍යස්ථාන 29ක් සඳහා තත්ත්ව වර්ධක සහතික (QIS) ලබා ගැනීමට කටයුතු කර ඇත.
VTY/A/NYSC/ 2021/AQ/01	2021 අප්‍රේල් 05 දින රාජ්‍ය දේපළ අවභාවිතය හා සම්පත් පෞද්ගලික පරිහරණය යනුවෙන් විගණකාධිපතිතුමා වෙත ලැබුණු මහජන පැමිණිලි පරීක්ෂාව.	මෙම නිළධාරී 2014.06.20 දින කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන MA – 1-1) සේවා ගණයේ සහකාර තරුණ සේවා නිළධාරී111 ශ්‍රේණිය තනතුරකට පත්ව ඇති අතර, සභාවේ සංවර්ධන කටයුතු වලට ආයතනයේ ප්‍රධානම අංශය වන ආයතන අංශයෙන් ලබාදිය යුතු දායකත්වය සැපයීම් සඳහා එවකට පැවති කළමනාකරණ සහකාර පුරප්පාඩු සපුරාලීම සඳහා මොහුව අනුයුක්ත කර

		ඇත. සේවයේ අවශ්‍යතාවය අනුව පාලන අධිකාරිය විසින් මොහුව ආයතන අංශයට යොමුකර ඇති අතර, ආයතන අංශයේ සිට සක්‍රීයව ක්ෂේත්‍රෙය් රාජකාරී ආවරණය කර ඇත. එබැවින් අදාල අවස්ථාවේ දී මෙම නිළධාරී විසින් යතුරු පැදීය ලබා ගැනීම සිදුකර ඇත. 2018.01.05 දින යතුරුපැදිය ලබා දී ඇති අතර, එම දිනෙන් පසු දිනක කළමනාකරණ සහකාර 111 ශ්‍රේණියට මාරුවී ඇත. යතුරුපැදියේ වෙලෙඳපල වටිනාකම අයකර ගැනීමට කටයුතු කෙරේ.
VTY/A/NYSC/ 2021/AQ/02	දෙවොල්මඩු ශාන්තිකර්මය - 2020 පිළිබඳ පරීක්ෂාව	මේ සම්බන්ධව මූලික විමර්ශනය අවසන් කර ඇති අතර,ඒ අනුව ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පවතී.
VTY/A/NYSC/ 2021/AQ/03	බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ජන්ගල් රිසෝට් ආයතනයේ පැවති වැඩමුළුව සම්බන්ධව	සෞභාග්‍යයේ දැක්ම ජාතික ප්‍රතිපත්ති ප්‍රකාරව නව දැක්මක් සහිත පුළුල් වැඩසටහන් කිහිපයක් 2021 වරස තුල ක්‍රියාත්මක කිරීමට ජාතික තරුණ සේවා සභාව අපේක්ෂා කරන ලදි. කොවිඩ්19 වසංගතය තුල ඒකාකාරීව ගෙවු තරුණ ප්‍රජාවගේ කායික හා මානසික සුවය යහපත් කර යථාර්ථවාදී ලෙස නැවත සාමාජගත කිරීම ජාතික තරුණ සේවා සභාව සතු වගකීමකි. ආයතනයේ නිළධාරීන් තුලද වසංගත තත්ත්වය හමුවේ විවිධ ගැටළුකාරී තත්ත්වයන් උද්ගත වී තිබුනි. ජාතික තරුණ සේවා සභාවේ පුහුණු මධ්‍යස්ථාන වල නේවාසික අභ්‍යාසලාභීන් නේවාසික අධ්‍යාපන කටයුතු වල නියැලෙමින් සිටින අතර, නාගරික පරිසරයෙන් මිදී නිදහස් පරිසරයක පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලදි. ත්‍රාසජනක ක්‍රීඩා හා බුද්ධි කලම්බන ක්‍රියාකාරකම්, වලින් යුත් පුහුණු වැඩසටහන අදාල ආයතනයේම ජාතික හා ජාත්‍යන්තර පුහුණුව ලත් උපදේශකයින් ගේ සහාය ලබා ගන්නා ලදි.අදාල දිනවලදී ආහාර, නේවාසික, ත්‍රාසජනක ක්‍රීඩා හා බුද්ධි කලම්භන ක්‍රියාකාරකම් සමග නිළධාරීන්ගේ පැවති මානසික ආතතිය දුරුකරමින් අවම මිලක් යටතේ කම්ටුවක් මගින් ඇල්ල ජංගල් රිසෝට් ආයතනය තෝරා ගන්නා ලදි.
SYA/B/NYSC/2 021/AQ/04	2021 වර්ෂයේ ටී ෂර්ට් සහ බොටම් මිලදී ගැනීම	අනපේක්ෂිත ලෙස රටපුරා ව්‍යාප්ත වූ කොවිඩ්19 වසංගතය හේතුවෙන් ඇති වූ සංචරණ සීමා, හා ඒකරාශීවීම් නොකළ යුතු බැවින් සැලසුම් කර තිබූ ප්‍රාදේශීය,දිස්ත්‍රික් හා ජාතික ක්‍රීඩා තරඟාවලිය සැලසුම් කල කාලසීමාව තුල පැවැත්වීමට නොහැකි

		වූ බැවින් ටී ෂර්ට් හා බොටම් අපේක්ෂා කළ පරිදි බෙදාහැරීමට නොහැකි විය. පසුව ක්‍රීඩා තරඟ ආරම්භ කර ඇති බැවින් ටී ෂර්ට් හා බොටම් බෙදා හරින ලදි
SYA/B/NYSC/2021/AQ/05	විධිමත් පාලන ක්‍රමවේදයකින් තොරව කටයුතු කිරීම පිළිබඳ පරීක්ෂාව	සේවා අවශ්‍යතාවය මත 2020.02.18 දින සිට අමල් සේනක උස්සාගොඩ මහතාට රියදුරු රාජකාරී වලට අමතරව තරුණ මධ්‍යස්ථාන පොදු කටයුතු අංශයේ සහාය භාරකරු ලෙස සභාපතිතුමා විසින් පත්කර ඇති අතර, රංගශාලාවේ වැඩසටහන් පැවැත්වෙන දිනයන් වල සංයුක්ත දීමනාවට සමාන මුදලක් ගෙවීමට ද සභාපතිතුමා අනුමැතිය ලබා දී ඇත. ජාතික තරුණ සේවා සභාවේ දිස්ත්‍රික්, පළාත් හා පුහුණු මධ්‍යස්ථානවල හා ප්‍රධාන කාර්යාලයේ,සියලුම රියදුරන් වෙත ප්‍රධාන ගේට්ටුවේ ක්‍රියාත්මක නීතිරීති වලට යටත්ව කටයුතු කරන ලෙසත් නියමිත පොත්වල සටහන් තබන ලෙසත් උපදෙස් ලබා දී ඇත. අධ්‍යක්ෂ(පාලන හා මානව සම්පත් කළමනාකරණ/මුදල්/සංවර්ධන) තනතුරු සඳහා විධිමත් පරිදි ස්ථිර පදනමින් බඳවා ගැනීමට හා අභ්‍යන්තර උසස්වීම් සඳහා අනුමැතිය ලැබී ඇත. විවිධ තනතුරු වල පුරප්පාඩු බොහොමයක් පැවතීම හේතුවෙන් ආයතනික කටයුතු පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය වෙනුවෙන් රාජකාරී ආවරණය සඳහා පත්කර ඇත.
SYA/B/NYSC/2021/AQ/06	ජාතික තරුණ සේවා සභාව් නිලධාරින් තනතුරට අනුව නිසි පරිදි සේවයේ නොයෙදවීම පිළිබඳ පරීක්ෂාව.(මහජන පරීක්ෂාව.)	ජාතික තරුණ සේවා සභාවේ පුරප්පාඩුව පවතින බොහෝ තනතුරු සඳහා ඉතා දීර්ඝ කාලයක් පුරා උසස්වීම් ස්ථිර පදනමින් ලබාදීම සිදුකර නොමැත. නමුත් ආයතනික කටයුතු පවත්වාගෙන යාම සඳහා ස්ථිර තනතුරු 28ක පුරප්පාඩු 228ක් සඳහා අයඳුම්පත් කැඳවා ඇතත් කොවිඩ්19 වසංගතය හේතුවෙන් පත්වීම් ලබාදීමේ කටයුතු අවසන් කරගත නොහැක් වූ අතර, රාජකාරී අවශ්‍යතාවය මත හා රාජකාරී අධීක්ෂණය කිරීමේ පදනම මත අදාල තනතුරු දැනට ලබාදී ඇත. දැනට 2021.02.28 දිනැති මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් තාවකාලික නවත්වා ඇති බැවින් අනුමැතිය ලද වහාම ඉදිරියේදී නිවැරදි කරගැනීමට කටයුතු කෙරේ.

SYA/B/NYSC/2021/AQ/07 2021.11.01	මතභේදයට තුඩු දෙන ගණුදෙණු	මුළු රටම කොරෝනා19 වසංගතය හේතුවෙන් මානසිකව වැටී ඇති අවස්ථාවක ජනතාවගේ සිත්තුල යම් සුවයක් ඇති කිරීම වස්, ජාතික තරුණ සේවා සභාව හා සම්බන්ධ වූ නර්තන, සංගීත නාට්‍ය ශිල්පීන්ගෙන් යුත් කණ්ඩායමක් මගින් Be happy with Youth වැඩසටහන ක්‍රියාත්මක කරන ලද අතර, සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතියට යටත්ව ගෙවීම් සිදුකර ඇත. සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සඳහා වූ සභා සංදේශය සකස්කර සභා රැස්වීම් වාරයට යොමුකර ඇත. තරුණ සේවා සභාවේ නිළධාරීන් සඳහා මෙම ගෙවීම් සිදු කර නොමැත. වර්ථමානයේ රට තුල පවතින කොවිඩ්19 වසංගතය හේතුවෙන් නිවසටම සීමාවි සිටින රටේ තරුණ ප්‍රජාවගේ මානසික සුවය රැකගැනීමත්, විවේක කාලය නිවසේ ආර්ථිකයට දායක කිරීම, රටේ කෘෂිකාර්මික නිෂ්පාදනයට තරුණ ප්‍රජාව දායක කර එතුලින් තරුණ ව්‍යවසායකයින් බිහිකිරීමේ අරමුණ ඇතිව සුහුරු ගෙවත්ත වැඩසටහන දිවයින පුරාම ආරම්භ කර ඇත. මෙම වැඩසටහන සියළු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ ආවරණය කරමින් දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් පැවැත්වෙන බැවින් ප්‍රචාරක මාධ්‍යයක් ලෙස ටී ෂර්ට් මුද්‍රණය කළ අතර, කාර්යාලීය ක්‍රමවේදයට අනුව ගබඩාව වෙත ලබාදී නැවත විශේෂ ව්‍යාපෘති අංශය භාරයට ගෙන අවශ්‍යතා පරිදි බෙදා හරින ලදි. පරිගණක උපදේශකවරුන්ට අදාල විෂය පථය ආවරණය කිරීම සඳහා ප්‍රායෝගික පුහුණුව Cisco ආයතනය මගින් ලබාදීමට තව නොබෝ දිනකින් ආරම්භ කිරීමට එම ආයතනය විසින් එකඟතාවය පළකර ඇති බැවින් එම පුහුණු වැඩසටහන් අවසන් වූ පසු උපකරණ යෝජිත මධ්‍යස්ථාන සඳහා ලබාදීමට සැලසුම් කර ඇත. ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ මෙම පාඨමාලාවන්ගේ මූලස්ථානය ස්ථාපිත කිරීමට සැලසුම් කල අතර, මෙම පුහුණු පාඨමාලා පැවැත්වීම සඳහා සුදුසු පරිදි ගොඩනැගිලි නවීකරණය කිරීමෙන් අනතුරුව එම මධ්‍යස්ථානය ස්ථාපනය කර අදාල උපකරණ ස්ථානගත කිරීමට අපේක්ෂිතය. මෙම උපකරණ ඉතා සංවේදී හා සියුම් උපකරණ බැවින් උපදේශක කාර්ය මණ්ඩලය පුහුණු කිරීමකින් තොරව මධ්‍යස්ථාන සඳහා භාණ්ඩ භාරදීම තුලින් අදාල උපකරණ වලට විශාල හානියක් සිදුවිය හැකි

		බැවින් මේ වන විට භාණ්ඩ සුරක්ෂිතව ගබඩා කර ඇත.
SYA/B/NYSC/2021/AQ/08	අපේක්ෂිත අරමුණු ඉටුනොවූ ඉදිකිරීම් පිළිබඳ පරීක්ෂාව	රියදුරු හා නේවාසිකාගාර ගොඩනැගිල්ල වැඩඅවසන් කර 2021.05.05 දින සවිකිරීම් ඇතුලත් ඉන්වෙන්ට්‍රියක් මඟින් ඉදිකිරීම් අංශය මඟින් මානව සම්පත් කළමනාකරණ අංශයට භාර දී ඇත. 2021.06.10 සී/ස තරුණ සේවා සමාගමට භාරදෙන ලද නව ගොඩනැගිල්ලේ දෙවන මහළ 2022.01.21 දින නැවත සභාව වෙත භාරදී ඇත. මේ වන විට රියදුරු නේවාසිකාගාරය රියදුරු මහතුන්ගේ පරිහරණය සඳහා යොදා ගෙන ඇත.
SYA/B/NYSC/2021/AQ/09	ජාතික තරුණ සේවා සභාවේ ප්‍රධාන ගබඩාව භෞතිකව පරීක්ෂා කිරීම	අළුතින් ඉදිකරන ලද ගොඩනැගිල්ලේ පහත මාලය ප්‍රධාන ගබඩාව සඳහා වෙන්කර ඇති අතර, ප්‍රතිපාදන නොමැති වීම තුල බෙදාවෙන්කර ගැනීම (Partition) ප්‍රමාදවී ඇත. කඩිනමින් අදාල කටයුතු කර තාවකාලිකව ස්ථාපිත කර ඇති ගබඩා දෙක ඉවත් කිරීමට කටයුතු කෙරේ. කොරෝනා19 වසංගතය හේතුවෙන් සේවකයින් කඩින් කඩ සේවයට කැඳවීමත් පුහුණු මධ්‍යස්ථාන සඳහා නිවාඩු ලබාදීත් හේතුවෙන් පුහුණු මධ්‍යස්ථාන සඳහා මිලදී ගත් භාණ්ඩ හා උපකරණ තාවකාලිකව ගබඩා කරන ලද අතර, මේ වන විට අදාල උපකරණ බොහොමයක් ක්ෂේත්‍රය සඳහා නිකුත් කර අවසන් වී ඇත.
SYA/B/NYSC/2021/AQ/10	මූල්‍ය විගණනය - 2021 - සබරගමුව පළාත් කාර්යාලය	ගෙවීම් වවුචර්,තත්කාර්ය අතුරු අග්‍රිම, අභ්‍යන්තර පාලන දුර්වලතා, නිෂ්කාර්ය වත්කම්, කළමනාකරණ අකාර්යක්ෂමතා හා පොත්පත් ලේඛන පරිහරණය සම්බන්ධව පෙන්වා දී ඇති අඩුපාඩු දුර්වලතා නිවැරදි කිරීමට පියවර ගැනේ.
SYA/B/NYSC/2021/AQ/11	රියදුරු නේවාසිකාගාරය හා ගබඩාව වෙනුවෙන් ඉදිවූ ගොඩනැගිල්ල පරිහරණය කිරීම පිළිබඳ විගණන පරීක්ෂාව - 2020	බාහිර පාර්ශවයන්ට ලබා දී ඇති ජාතික තරුණ සේවා සභාව සතු ගොඩනැගිලි වෙනුවෙන් අයවිය යුතු වටිනාකම් නිර්ණය කිරීම සඳහා තක්සේරු වාර්තා ලබා ගැනීමෙන් අනතුරුව අදාල ගාස්තු අයකිරීම සඳහා වන ක්‍රමවේදයක් සකස් කර සභා අධ්‍යක්ෂ මණ්ඩල තිරණ අංක 38/2021 යටතේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

09.ආශ්‍රිත වාර්තා / ලේඛන.

- වාර්ෂික වාර්තාව 2020, ජාතික තරුණ සේවා සභාව.
- මූල්‍ය වාර්තාව 2021, ජාතික තරුණ සේවා සභාව.
- ක්‍රියාත්මක සැලැස්ම 2021 ජාතික තරුණ සේවා සභාව.
- දිස්ත්‍රික් ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව.
- ප්‍රධාන කාර්යාලීය අංශ ප්‍රගති වාර්තා, ජාතික තරුණ සේවා සභාව.
- භාණ්ඩාගාර /අමාත්‍යාංශ සංවර්ධන වියදම් වාර්තාව - 2021, ජාතික තරුණ සේවා සභාව.

ඇමුණුම 01 - විගණක කමිටු වාර්තාව

විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම සම්බන්ධව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව පැවැත්විය යුතු කමිටු සංඛ්‍යාව 04 ක් ලෙස නිර්ණය කර ඇති අතර, කොවිඩ්19 වසංගතය හේතුවෙන් 2021 වර්ෂයේ පැවැත්වීමට හැකිවූයේ කමිටු රැස්වීම් වාර 03ක් පමණි.

අදාල රැස්වීම් පැවැත්වීමෙන් අනතුරුව ගන්නා ලද කමිටු තීරණ ඇතුලත් වාර්තා සහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. ගන්නා ලද කමිටු තීරණයන්හි සම්පින්ඩනයක් පහත දක්වා ඇත.

- රජයේ විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු අවම කිරීම සඳහා කටයුතු කිරීම
- අභ්‍යන්තර විගණන හා විමර්ශන වාර්තා මගින් පෙන්වා දී ඇති අඩුපාඩු මඟ හරවා ගැනීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳ නිරීක්ෂණ ලබාදීම
- සමස්ථ ඉඩම් හා දේපල පවරා ගැනීමේ පටිපාටිය පිළිබඳ ප්‍රගති සමාලෝචනය
- ආයතනික සේවක මණ්ඩල කටයුතු සම්බන්ධ සමාලෝචනය
- ආයතනික සංවර්ධන කටයුතු පිළිබඳ සමාලෝචනය
- වත්කම් භාරකාරත්වය හා භාණ්ඩ සමීක්ෂණ කටයුතු පිළිබඳ සමාලෝචනය
- වාර්ෂික ගිණුම් කටයුතු සම්බන්ධව
- ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත ආයතනයන්හි කටයුතු පිළිබඳ විමර්ශනයට ලක්කිරීම

ඇමුණුම 02 – මූල්‍ය විගණන ප්‍රකාශය.



03

ජාතික තරුණ සේවා සභාව
මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය
2021-12-31 දිනට

(රු.000)

විස්තරය	උප. අංක	2021-12-31 දිනට	2020-12-31 දිනට
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් සහ මුදල් සමාන දෑ	01	82,488	29,436
ලැබිය යුතු දෑ	02	185,788	208,794
තොග	03	7,582	6,379
වෙනත් ජංගම වත්කම්	04	363	348
		276,221	244,957
වෙනත් මූල්‍ය වත්කම්			
ආයෝජන	05	1,799	1,799
		1,799	577,773
ජංගම නොවන වත්කම්			
පිරියක හා උපකරණ	06	466,983	501,212
ඉඩම් හා ගොඩනැගිලි	07	2,283,615	2,064,903
කෙරීගෙන යන වැඩ	08	559,342	575,974
අනිරි තොගය (පශු සම්පත්)	09	3,889	1,403
		3,313,829	2,567,518
මුළු වත්කම්		3,591,849	3,390,248
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු දෑ	10	138,356	137,123
වෙනත් බැරකම්	11	49,321	9,518
		187,677	146,641
ජංගම නොවන බැරකම්			
පාරිතෝෂික වෙන් කිරීම්	12	490,159	497,361
මුළු බැරකම්		677,836	644,001
ශුද්ධ වත්කම්		2,914,013	2,746,246
ශුද්ධ වත්කම්/ ස්කන්ධය			
වෙනත් රාජ්‍ය අස්නිත්වයන්ගේ දායක වූ ප්‍රාග්ධනය	13	6,408,425	6,177,534
සංචිත	14	435,264	247,430
සමුච්චිත අතිරික්තය /(ඌනතාවය)		(3,929,675)	(3,678,718)
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය		2,914,013	2,746,246

එම.සි. ඇපෙර්රා
අධ්‍යක්ෂ (මූදල්) -චැ.බ.
ජාතික තරුණ සේවා සභාව

දමිත වික්‍රමසිංහ
සභාපති අධ්‍යක්ෂ/ජනරාල්
ජාතික තරුණ සේවා සභාව

ගිණුම්කරණ ප්‍රතිපත්ති පිටු අංක 01 සිට 02 දක්වා ද, ගිණුම්කරණ සටහන් පිටු අංක 05 සිට 15 දක්වා ද, ඇතුලත් මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ හා ඉදිරිපත් කිරීමේ වගකීම සභාවේ [illegible]

[illegible]

01. A.B.L. Chathuranga - සභා අධ්‍යක්ෂ
02. H.H. Sirisena - සභා අධ්‍යක්ෂ

3-1

ජාතික තරුණ සේවා සභාව
2021-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූලික කාර්යසාධන ප්‍රකාශනය

විස්තරය	උප අංක	(රු.000) 2021.12.31	(රු.000) 2020.12.31
ආදායම්			
රජයේ දායකය (පුනරාවර්තන)		1,201,442	1,211,725
රජයේ දායකය (සංවර්ධන)		274,427	199,958
		1,475,869	**1,411,683**
බාහිර දායකය (පුනරාවර්තන)			
පළාත් සභා		393	208
අමාත්‍යාංශ හා රාජ්‍ය ආයතන (පුනරාවර්තන)		102,120	63,392
විදේශ සංවිධාන		8,465	8,838
වෙනත් බාහිර ආයතන		4,091	27,859
		1,590,938	**1,511,979**
අභ්‍යන්තර ඉපයීම්			
ජාතික තරුණ මධ්‍යස්ථාන අදායම් (මහරගම)	15	24,403	23,781
පුනුණු මධ්‍යස්ථාන ආදායම්	16	120,840	113,711
විවිධ ආදායම්	17	9,894	12,855
සංදර්ශන ආදායම්		226	823
ස්ථාවර වත්කම් ඉවත් කිරීම් ලාභය		934	35
අඩමාණ ණය අධි වෙන්කිරීම		35	135
ගොවිපොල කාරක ගිණුම	18	6,638	5,533
		162,971	**156,873**
		1,753,908	**1,668,852**
මෙහෙයුම් වියදම්			
අඩු කළා :-			
ආයතන හා පරිපාලන වැය	19	1,239,858	1,223,496
ස්ථාවර වත්කම් ක්ෂය		274,552	246,627
		(1,514,410)	(1,470,122)
		239,498	**198,730**
තරුණ සංවර්ධන වියදම්	19		
සෞන්දර්ය කුසලතා සංවර්ධන අංශය	2-1	66,465	50,699
මාධ්‍ය අංශය	2-2	5,204	1,273
පරීක්ෂණ හා සැලසුම් අංශය	2-3	8,170	921
වෘත්තීය මාර්ගෝපදේශන හා උපදේශන අංශය	2-4	689	4,508
කාර්මික හා වෘත්තිය පුනුණු අංශය	2-6	43,166	42,329
ජාතික තරුණ මධ්‍යස්ථාන නඩත්තු අංශය	2-7	3,086	4,929
ජාතයන්තර තරුණ සම්බන්ධතා අංශය	2-8	12,046	8,053
යෞවන නිලධාරී අධිකාරී අංශය	2-9	3,689	770
ක්‍රීඩා සංවර්ධන අංශය	2-10	99,542	66,423
තරුණ සංවිධාන හා සංවර්ධන අංශය	2-11	43,858	8,814
ආදායම් ප්‍රවර්ධන හා ගොවිපල සංවර්ධන අංශය	2-12	7,941	9,787
තරුණ සමුපකාර හා ව්‍යාපාර සංවර්ධන අංශය	2-13	3,688	999
නිස්සෙක් විසියෝ අංශය	2-14	3,991	2,007
ඇගයීම් අංශය	2-15	15	1,344
තොරතුරු තාක්ෂණ අංශය	2-17	756	728
විශේෂ ව්‍යාපෘති අංශය	2-18	31,809	48,033
ඉඩම් අංශය	2-19	5,822	6,897
පුනුණු මධ්‍යස්ථාන	2-6-1-2	131,122	115,596
ජාතික තරුණ මධ්‍යස්ථානය - මහරගම	2-6-1	17,629	22,627
		(488,687)	(396,736)
වර්ෂයේ අතිරික්තය/උනතාවය		(249,189)	(198,007)
එකතු කළා :-			
වියදම් අතිරික්තය/උනතාවය (2021.01.01)		(3,678,718)	(3,439,193)
පෙර වර්ෂ වියදම් ගැලපීම්		(1,769)	(41,518)
ඉදිරියට ගෙනා ශේෂය		**(3,929,675)**	**(3,678,718)**

ඇමුණුම් 03 - විගණකාධිපති වාර්තාව හා ජාතික තරුණ සේවා සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහාවූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එස්වයිජේ/බී/එන්වයිඑස්සී/1/21

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 31 දින

සභාපති
ජාතික තරුණ සේවා සභාව

ජාතික තරුණ සේවා සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික තරුණ සේවා සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර, සමාගම විසින් 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර ද නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 99 ඡේදයට අනුව ගිණුම් කාල පරිච්ඡේදයට අදාල ආදායම් හා වියදම් අයිතම පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ඇතුළත් කල යුතු වුවද, පෙර වර්ෂයට අදාල එකතුව රු. 6,173,432 ක් වූ ආරක්ෂක හා දුරකථන වියදම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගලපා නිබීම නිසා වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වුණි.

(ඇ) 2020 සහ 2021 වර්ෂවලදී ඉඩම් හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරා තිබුණු රු. 5,196,942 ක් වූ ප්‍රාග්ධන වියදම් වර්ෂයේ අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර නිබීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ ශුද්ධ ඌනතාවය වැඩියෙන් ද ස්ථාවර වත්කම් අඩුවෙන් ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම් ද රු. 312,138 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඈ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් කාණ්ඩයකට අයත් සියළුම දේපල ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, 2021 වර්ෂයේදී මධ්‍යස්ථාන පහකට අයත් ගොඩනැගිලි පමණක් රු. 46,546,500 කට ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නිබුණි.

(ඉ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණ පිරිවැය රු. 1,780,839,673 ක් වූ වත්කම් වර්ග 11 ක් සඳහා වූ ඵලදායී ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව නැවත ප්‍රතිශෝධනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොතිබුණි..

(ඊ) සභාවට නීත්‍යානුකූලව පවරා තිබුණු අක්කර 03 පර්චස් 92 ක ප්‍රමාණයක් වූ ඉඩම් කැබලි 03 ක විටිනාකම් තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට සීමාසහිත ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම වෙත ගෙවිය යුතු ශේෂය ලෙස රු. 164,162 ක් දක්වා නිබුණ ද සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව එදිනට සභාවෙන් අයවිය යුතු ශේෂය රු.104,300,311 ක් වූයෙන් රු. 104,136,149 ක නොසැසඳීමක් නිරීක්ෂණය වුවද එම වෙනස්කම් පිළිබඳ සොයාබලා අවශ්‍ය ගැලපීම් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර නොතිබුණි .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන ජාතික තරුණ සේවා සභාවේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සභාවේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් නිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තක්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ (අ), (ආ), (ඉ) , (ඊ), හා (උ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

	නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ)	2018 දෙසැම්බර් 07 දිනැති අංක PS/SP/SB/21/2018 දරන ජනාධිපති ලේකම්ගේ වක්‍රලේඛය	සභාව සතුව නේවාසික පාඨමාලා පැවැත්වීම සඳහා පුහුණු මධ්‍යස්ථානවල ප්‍රමාණවත් පහසුකම් තිබියදී 2021 පෙබරවාරි සහ මාර්තු මාසවල බදුල්ල දිස්ත්‍රික්කයේ පිහිටි පෙද්ගලික ආයතනයක පුහුණු වැඩසටහන් 03 ක් පවත්වා ඒ සඳහා නිලධාරීන් 194 ක් වෙනුවෙන් ආහාර හා නේවාසික පහසුකම් වෙනුවෙන් රු. 3,246,600 ක් වියදම් දරා තිබුණි.

(ආ) 2015 සැප්තැම්බර් 25 දිනැති අංක SP/SB/07/15 දරන ජනාධිපති ලේකම්ගේ වක්‍රලේඛය

අවම පිරිවැයක් යටතේ ඉහළ ප්‍රතිලාභ ලබාකර ගත හැකි වන පරිදි උත්සව සංවිධානය කර ක්‍රියාත්මක කළ යුතු වුවත්, එරමිණියාය ගොවිපල පුහුණු මධ්‍යස්ථානයේ 2020 වර්ෂයේ වප්මගුල් හා රන් අස්වනු නෙලීමේ උත්සවය වෙනුවෙන් එකතුව රු. 399,176 ක් දරා තිබූ අතර මෙම වියදම් තුළ සංග්‍රහ වියදම් හා සභාපති ඇතුළු නිලධාරියකුගේ නවාතැන් පහසුකම් ලෙස රු. 290250 ක හොටෙල් ගාස්තු ඇතුළත් වී තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

(අ) සභාව විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් සඳහා සහභාගී වන නිලධාරීන්ට බෙදාහැරීම සඳහා ටී ෂර්ට් සහ කලිසම් එකතුව 7000 ක ප්‍රමාණයක් රු. 4,706,100 ක් වැය කර 2021 අප්‍රේල් 30 දින මිලදී ගෙන තිබුණ ද ඉන් 2021 ඔක්තෝබර් 15 දින වන විටත් ගබඩාවේ 5453 ක තොගයක් පැවතුණි. එසේ තිබියදී සුහුරු ගෙවත්ත වැඩසටහන සඳහා 2021 අගෝස්තු 13 හා සැප්තැම්බර් 28 යන දිනයන්හි රු. 643,500 ක් වැයකර ටී ෂර්ට් 900 ක් මිලදී ගෙන තිබුණි

(ආ) 2020 වර්ෂයේ ආරම්භ කර තිබුණු එරමිණියාය ස්විස් පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘති හතරක් 2021 ඔක්තෝබර් 10 වන දින දක්වාම නිම කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙම ඉදිකිරීම් සඳහා එකතුව රු. 4,563,066 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකුට ගෙවීම් කර තිබුණ ද , එම ද්‍රව්‍ය වලින් සියයට 54 ක් හෙවත් එකතුව රු. 2,459,188 ක් වටිනා ද්‍රව්‍ය ඉදිකිරීම් භූමියට ලැබුණු බවට ව්‍යාජ ලේඛන සකස් කර නිලධාරීන් විසින් අයථා පරිහරණය කර තිබුණි. මේ සම්බන්ධව වන අලාභය 2022 අප්‍රේල් දක්වාම වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නිරෝගීමත් ක්‍රියාශීලී ජීවන රටාවකට තරුණ පරපුර හුරු කිරීම උදෙසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා යෞවන සමාජ මට්ටමින් කායවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩසටහන යටතේ එරමිණියාය සෞන්දර්ය හා ගොවිපල පුහුණු මධ්‍යස්ථාන භූමියේ කාය වර්ධන

මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම හා උපකරණ කට්ටල මිලදී ගැනීම වෙනුවෙන් එකතුව රු. 1,095,258 ක් වැයකර තිබුණද එම මධ්‍යස්ථානය භාවිතා නොකිරීම හේතුවෙන් සම්පූර්ණ ව්‍යදම නිෂ්කාර්ය ව්‍යදමක් බවට පත්වී තිබුණි.

(ඇ) 2021 වර්ෂය තුළදී ජාතික තරුණ සේවා සභාව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පෞද්ගලික සමාගමට ලබාදී තිබූ රු. 3,045,700 ක් වටිනා මුද්‍රණ ඇණවුම් 08 ක් සමාගම විසින් බාහිර ආයතන මගින් ඉටුකරවාගෙන සියයට 10 සිට සියයට 108 දක්වා වූ ලාභ ආන්තිකයක් තබාගෙන තරුණ සේවා සභාවට එකතුව රු. 3,886,370 ක වටිනාකමකට ලබාදී තිබුණි.

2.3 වෙනත් කරුණු

(අ) ජාතික තරුණ සේවා සභාව විසින් නිසි සැලසුමකින් තොරව 2021 දෙසැම්බර් මස රු. ලක්ෂ 240 කට අධික වටිනාකමකින් යුත් මිලදී ගන්නා ලද භාණ්ඩ රාශියක් වර්ෂයකට ආසන්න කාලයක් හෙයියන්තුබුව පුහුණු මධ්‍යස්ථානයේ ගබඩා කර තිබුණි. එම භාණ්ඩ තුළ වගකීම් කාලය සම්පූර්ණයෙන්ම ඉකුත් වූ එකතුව රු. 1,720,377 ක් වූ Sony Hi Fi System 23 ක් හා මුළු වගකීම් කාලයෙන් අඩක් ඉකුත් වූ එකතුව රු. 3,454,922 ක් වූ රූපවාහිනී හා මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් 46 ක් හා රු. ලක්ෂ 120 ක් වටිනා කිලෝ ග්‍රෑම් 25 ක රෙදි සෝදන යන්ත්‍ර හා රෙදි වියලන යන්ත්‍ර 03 බැගින් මිලදී ගෙන තිබූ අතර, එම යන්ත්‍ර භාවිතා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ශ්‍රී ලංකා යුත් ස්ටාර්ට් අප් චැලේන්ජ් වැඩසටහන යටතේ උප වැඩසටහන් 4 ක් සඳහා 2021 දෙසැම්බර් 20 දින වන විට රු. 1,402,810 ක් වැයකර තිබුණද එම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම මත එම මුදල නිෂ්ක්‍රීය ව්‍යදමක් බවට පත්වී තිබුණි.

(ඇ) කිසිදු ගාස්තුවක් අයකර ගැනීමකින් තොරව තරුණ සේවා සමාගමට සභාවේ ගොඩනැගිලි භාවිතා කිරීමට ඉඩ පහසුකම් ලබාදී තිබියදීත් ගබඩාවක් සහ රියදුරන් 50 කට පමණ නේවාසික පහසුකම් සැපයීමට ඉදිකර තිබුණු පිරිවැය රු. 107,526,046 ක් වූ නව ගොඩනැගිල්ලේ දෙවන මහල අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමකින් තොරව සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියකින් තොරව සභාපතිවරයා විසින් 2021 ජුනි 10 දින ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ලබාදී තිබුණි. කෙසේ නමුදු 2016 වසරේ සිට වසර පහකට ආසන්න කාලයක් සභාවේ ප්‍රධාන ගබඩාව තාවකාලිකව ස්ථාන 03 ක අනාරක්ෂිතව පැවතුණි.

(ඇ) ආදායම් එකතුකර ගැනීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් ජාතික තරුණ සේවා සභාවට අයත් එරම්ණියාය සෞන්දර්ය හා ගොවිපල පුහුණු මධ්‍යස්ථානයේ වී නොග පෞද්ගලික පරිහරණයට ගැනීම, අස්ථානගතවීම හා නාස්ති වීම යනාදී හේතු නිසා වටිනාකම රු. 1,133,142 ක් වූ වී කිලෝ ග්‍රෑම් 8435 ක නොගයක් හා බිත්තර නිෂ්පාදනයෙන් රු. 127,579 ක ආදායමක් අහිමි වී තිබුණි.

(ඉ) සභාව විසින් සිස්කෝ පරිගණක පුහුණු පාඨමාලාව ආරම්භ කිරීමට සැලසුම් කර සිස්කෝ ජාත්‍යන්තර සමාගම හා සභාව අතර 2020 දෙසැම්බර් 04 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඒ සඳහා 2021 ජූලි 15 දින රු. 15,708,1736 ක් වටිනා උපකරණ මිලදීගෙන තිබුණ ද එම උපකරණ 2021 ඔක්තෝබර් 29 දින තෙක් නිෂ්කාර්යව ගොඩගසා තිබුණි. කෙසේ වුවද, විධිමත් ක්‍රමවේදයකින් තොරව නිලධාරීන් 10 දෙනෙකු අළුතින් බඳවාගෙන ඒ සඳහා 2021 ඔක්තෝබර් වන විට රු. 4,174,874 ක් පමණ සමස්ථ වියදමක් දරා සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ පරිගණක පාසල සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම යටතේ පිහිටුවීමට කටයුතු කර තිබුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

අංක 306/72, පොළුදුව පාර, බත්තරමුල්ල.

(9)

ඇමුණුම 04 - ජාතික තරුණ සේවා සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධ ප්‍රගතිය.

විගණන නිරීක්ෂණය	වත්මන් ප්‍රගතිය
1.5 <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ</u> **1.5.1 <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය</u>** ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වා ගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබා ගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.	මේ සම්බන්ධයෙන් වර්තමානය වන විට විෂය භාර නිලධාරීන් සමඟ සාකච්ඡා කර විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රම හා උපදෙස් මාලාවක් හඳුන්වා දී ඇත .ඒ අනුව මේ වන විට අවශ්‍ය පරිදි ගිණුම්කරණ පරිගණක පද්ධතිය යාවත්කාලීන කරමින් පවතී. 2022 වර්ෂය අවසානයේ ගිණුම්කරණ පරිගණක පද්ධතිය මගින්ම අවසන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සිදු කිරීමට ද බලාපොරොත්තු වේ. තවද උපචිත පදනම මත අවසන් ගිණුම් සකස් කිරීමට අදාලව නිළධාරීන් දැනුවත් ඇති අතර ඒ අනුව වගකිමෙන් යුතුව සිය රාජකාරී කාර්යක්ෂමව සිදු කරන ලෙස සියළුම මූල්‍ය නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත.
<u>1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම</u> (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 01 හි 99 ඡේදයට අනුව කාල පරිච්ඡේදය තුළ හඳුනාගත් සියළුම ආදායම් හා වියදම් අයිතම් ලාභ හෝ අලාභ වල ඇතුළත් කල යුතු වුවද, පෙර වර්ෂයට අදාල එකතුව රු. 6,173,432 ක් වූ ආරක්ෂක හා දුරකථන වියදම් සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා තිබූ අතර ඒවා සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	2022 වර්ෂයේ සිට අවසන් ගිණුම් සකස් කිරීම සඳහා පියවර ගෙන ඇති අතර, උපචිත පදනම මත අවසන් ගිණුම්සකස් කිරීමට සියළුම මූල්‍ය නිලධාරීන්ට උපදෙස් ලබාදී ඇත .

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය ප්‍රකාරව ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේදී වත්කම් කාණ්ඩයකට අයත් සියළුම දේපල ප්‍රත්‍යාගණනය කළ යුතු වුවත්, 2021 වර්ෂයේදී මධ්‍යස්ථාන පහකට අයත් ගොඩනැගිලි පමණක් රු. 46,546,500 කට ප්‍රත්‍යාගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කර තිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදයට ප්‍රකාරව ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයට අදාලව ජාතික තරුණ සේවා සභාව විසින් භුක්ති විඳින ඉඩම් හා ගොඩනැගිලි පවරාගැනීම් කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යනු ලබන අතර මේ සම්බන්ධයෙන් ඉඩම් හා ගොඩනැගිලි පිහිටි පළාත් කාර්යාලවලට අයත් රජයේ පළාත් තක්සේරු දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල වෙත තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා වන ලිඛිත ඉල්ලීම යවා ඇත. ඒ අනුව අදාල රජයේ තක්සේරු වාර්තා 38 ක් ලැබී ඇති අතර ඊට අදාල ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.
(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් ප්‍රවර්ථන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන් ක්ෂය කර තිබූ පිරිවැය රු. 1,780,839,673 ක් වූ වත්කම් වර්ග 11 ක් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව, ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි .එහි දළ ධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කර නොතිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත 07 හි 47 හා 65 ඡේද ප්‍රකාරව තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන ජංගම නොවන වත්කම් රජයේ පිළිගත් තක්සේරුකරුවන් ලවා තක්සේරුකර ප්‍රත්‍යාගණනය සිදුකොට අදාල ගිණුම්ගත කිරීම් 2022 වර්ෂයේදී ආරම්භ කිරීමට කටයුතු කරන බව දන්වා සිටින අතර ජංගම නොවන වත්කම්වල දළ ධාරණ අගය 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙලිදරව් කිරීමට කටයුතු කරන බවද දන්වා සිටිමි.
1.5.3 ගිණුම්කරණ අඩුපාඩු (අ) සභාවට නීත්‍යානුකූල අයිතිය තිබූ අක්කර 03 පර්චස් 92 ක ප්‍රමාණයක් වූ ඉඩම් 03 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	2022 වර්ෂයේ අවසාන ගිණුම් සකස් කිරීමේ දී මෙය ගිණුම්ගත කිරීම සඳහා කටයුතු කෙරේ.
(ආ) 2019 වර්ෂයේ සුගතදාස ක්‍රීඩාංගණය වෙත යෞවන ක්‍රීඩා උළෙල පැවැත්වීම වෙනුවෙන් ලබාදී තිබූ රු. 2,293,733 ක මුදල 2021 වර්ෂයේදී පවත්වනු ලැබූ යෞවන ක්‍රීඩා උළෙල වෙනුවෙන් දරා තිබුණද එම මුදල 2021 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත නොකර 2019 වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌණතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි.	2019 වර්ෂයේ පැවැත්වීමට නියමිතව තිබූ ජාතික ක්‍රීඩා උත්සවය එම දිනවල රටේ පැවැති අධික වර්ෂා තත්වය මත අවලංගු කරනු ලැබූ අතර එම තරගාවලිය සඳහා සුගතදාස ක්‍රීඩාංගනයට ගෙවූ මුදල නැවත ජාතික තරුණ සේවා සභාව වෙත ලබාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකලද එම ක්‍රීඩාංගනයේ පරිපාලනයේ පැවති අභ්‍යන්තර මූල්‍ය කොන්දේසි මත එම මුදල නැවත මුදලින් ලබා දිය නොහැකි බවත්, ඉදිරි තරගාවලියකදී එම වියදමට හිලව්කර ගැනීමටත් එකඟ වී ඇත. තවද 2020 වර්ෂයේදී ද රටේ පැවැති කොවිඩ් 19 වසංගත තත්වය මත ජාතික ක්‍රීඩා උත්සවය පැවැත්වීමට නොහැකි වූ අතර 2021 වර්ෂයේ දෙසැම්බර් මාසයේ මෙම ක්‍රීඩා උත්සවය පැවැත්වුනු අතර, එම

	වියදම , 2019 වර්ෂයේ ගෙවූ මුදලට හිලව් කිරීම මත වැරදි ආකාරයට 2019 වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගතකර ඇත.ඉදිරි වර්ෂයේදී මෙවැනි මූලික ගිණුම්කරන දෝෂ ඇති නොවීමට වගබලාගන්නා අතර අදාල නිලධාරීන් විෂයානුබද්ධව දැනුවත් කර ඇත.
(ආ) 2020 සහ 2021 වර්ෂවලදී ඉඩම් හා ගොඩනැගිලි වැඩිදියුණු කිරීම වෙනුවෙන් දරා තිබුණු රු. 5,196,942 ක් වූ ප්‍රාග්ධන වියදම වර්ෂයේ අයභාර වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ ශුද්ධ ඌණතාවය වැඩියෙන්ද ස්ථාවර වත්කම් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම ද රු. 312,138 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.	2021 වර්ෂයේ කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතින ඇඹිලිපිටිය පුහුණු මධ්‍යස්ථානයේ ගොඩනැගිලිවලට නිෂ්පාදන යන්ත්‍රවලට අදාලව නිවැරදි කිරීම් මේ වන විට සිදු කර ඇත. මෙම ඉඩම් සම්බන්ධයෙන් රජයේ තක්සේරු වාර්තා ලබාගැනීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදුකර ඇති අතර යායවත්ත ඉඩම සඳහා රජයේ තක්සේරු දෙපාර්තුමේන්තුවේ අදාල තක්සේරු වාර්තා ලැබී ඇති අතර අදාල වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු සිදු කරමින් පවතී. ඔරුබැදිවැව පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම ජාතික තරුණ සේවා සභාව විසින් භුක්ති විඳින අතර මෙම ඉඩමේ වර්තමාන අයිතිය තරුණ කටයුතු අමාත්‍යාංශය වෙත පවතින අතර මෙම ජාතික තරුණ සේවා සභාවට නිදහස්කර ගැනීමට අවශ්‍ය පියවර ගනිමින් සිටින අතර රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම සම්බන්ධ තක්සේරු වාර්තාව ලබාදී ඇති නිසා එම වාර්තාව මත පදනම්ව ප්‍රත්‍යාගණනය සිදුකොට ලාභය ගිණුම් ගතකර ඇත. 2022 වර්ෂයේ දෙවන කාර්තුවේදී මෙම නිවැරදි කිරීම් සිදුකර නිවැරදිව ගිණුම්ගත කර ඇත.
1.5.4 <u>නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා</u> **මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම(රු)** | **අනුරූපී වාර්තා අනුව වටිනාකම(රු)** | **වෙනස(රු)** 164,162 | 104,300,311 | 104,136,149	සීමා සහිත තරුණ සේවා සමාගම සඳහා මේ වනවිට ගෙවිය යුතු වවුචර්පත් වටිනාකම රු.12,345,108.00 ක් වන අතර, මෙම වියදම් භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ දරා ඇති වියදම් වන අතර 2021 වර්ෂයේ භාණ්ඩාගාර ප්‍රතිපාදන වෙන්කිරීමට අදාලව මුදල් නොලැබීම මත එම වර්ෂයේදීම ගෙවීම් කිරීමට නොහැකි වී ඇත. මහා භාණ්ඩාගාරය මුදල් පදනම මත ගිණුම් සකස් කරන බැවින් හා භාණ්ඩාගාරය ණයගැතියකු ලෙස ගිණුම්ගත කල නොහැකි වීමත් මත සී/ස තරුණ සේවා සමාගමට ගෙවිය යුතු ශේෂය ණයහිමි ලෙස ගිණුම්ගත කිරීමට නොහැකි වී ඇත. 2022 වර්ෂයේ මෙම ශේෂයන් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය

	ප්‍රතිපාදන ලබාගැනීමට පරිපූරක ඇස්තමේන්තුවක් මඟින් මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කර ඇති අතර 2022 වර්ෂයේ සිට විධිමත් මූල්‍ය පාලනයක් යටතේ අදාල වියදම් ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව ගිණුම්ගත කෙරෙන බව දන්වා සිටිමි. ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් 2010 වර්ෂයේ සිට ලැබිය යුතු මුදල පොත්වලින් ඉවත් කිරීමට සහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබීමෙ විගණන විමසුමේ පෙන්වා ඇති කොන්ත්‍රාත් 07 අතුරින් නිල්වලා තුරුණු උයන ඉදිකිරීමට අදාල ව්‍යාපෘතිය මෙතෙක් අවසන් කර නොමැති අතර රත්මලාන පුහුණු මධ්‍යස්ථානය නවීකරණය කිරීමට අදාල ව්‍යාපෘතිය 2015 වර්ෂයේදී අවසන් වී ඇතත් කොන්ත්‍රාත් ආයතනය සමඟ පවතින අරමුදල් බෙරුම් කරන ක්‍රියාවලියක් පවතින බැවින් ද තවදුරටත් එම ව්‍යාපෘති සඳහා ශේෂය රදවාගත යුතුව ඇති බව දන්වා සිටිමි. අනෙකුත් ඉදිකිරීම් සම්බන්ධව කොන්ත්‍රාත් රඳවා ගැනීම් වලට අදාලව මුදල් නිදහස් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කෙරෙමින් පවතී.
1.5.5 ඒකාබද්ධ කිරීම ජාතික තරුණ සේවා සභාවේ සියයට 98 ක කොටස් හිමිකාරත්වයක් ඇතිව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම 1981 වර්ෂයේදී ආරම්භ කර තිබුණද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබූ අතර , සමාගම විසින් 2018 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන සකස් කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	සී/ස තරුණ සේවා සමාගම, සමාගම් පනත යටතේ ලියාපදිංචි ආයතනයක් වන බැවින් මෙම සමාගම විසින් අවසන් ගිණුම් පිළියෙල කරනු ලබන්නේ අප්‍රේල් 01 වන දා සිට මාර්තු 31 න් අවසන් වන ගිණුම් වර්ෂයටය. එසේ සකස්කරන ගිණුම් සමාගම රෙජිස්ට්‍රාර් වෙත (ලියාපදිංචිය යාවත්කාලීන කිරීමට) හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරයි. නමුත් ජාතික තරුණ සේවා සභාව ව්‍යවස්ථාපිත මණ්ඩලයක් ලෙස 1979 අංක 69 දරණ පනත යටතේ ස්ථාපිත කොට ඇති බැවින් සභාවේ මූල්‍ය වර්ෂය ජනවාරි 01 වනදා සිට දෙසැම්බර් 31 ක දක්වා වේ. ඒ අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා සමාගමේ ගිණුම් තරුණ සේවා සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන අනුරූපයට (format) නියමිත දිනට ඉදිරිපත් කල යුතුයි. තරුණ සේවා සමාගමේ මූල්‍ය ප්‍රකාශන ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා සමාගමේ විගණකවරුන් විසින් සහතික කර ඉදිරිපත් කරන්නේ නම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන

	පිළියෙලකර ඉදිරිපත් කල හැකිය. මේ පිළිබඳව සභා අධ්‍යක්ෂ මණ්ඩලයේදී ද දීර්ඝ වශයෙන් සාකච්ඡා කල අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සභා අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාවය ලැබුණි.ඒ සඳහා අවශ්‍ය උපදෙස් සභාපති/අධ්‍යක්ෂ ජනරාල් විසින් තරුණ සේවා සමාගම වෙත දන්වා ඇති අතර සභාව් ගිණුම් අංශය මගින් අධීක්ෂණයක් සිදු කිරීමට ද උපදෙස් ලබා දී ඇත. එසේම සී/ස තරුණ සේවා සමාගමේ 2019/2020 මුල්‍ය වර්ෂයට අදාල මුල්‍ය ප්‍රකාශන කට්ටලය තවමත් විගණනය වී නොමැති අතර ඉදිරි මුල්‍ය වර්ෂ සඳහා මුල්‍ය ප්‍රකාශන සකස් කර නොමැති බැවින් ඒ අනුව එම කටයුතු කඩිනම් කර ගැනීමට අවශ්‍ය උපදෙස් සමාගම වෙත ලබා දී ඇති අතර ඒ සඳහා කඩිනමින් ගණකාධිකාරවරයෙකු බඳවා ගන්නා ලෙසද උපදෙස් ලබා දී ඇත.තවද සභාවේ ගිණුම් ලාභ නොඋපයන ආයතනයක් වන අතර ඊට අදාල ගිණුම් ප්‍රමිත අනුව අවසාන ගිණුම් පිළියෙල කරනු ලබයි.නමුත් සමාගම සමාගම් පනත යටතේ ව්‍යවස්ථාපිත ලාභ උපයන ආයතනයක් බැවින් එම සමාගම වෙළඳ ලාභ /අලාභ ගිණුමක් හා ශේෂ පත්‍රයක් අනුව ඊට අදාල ප්‍රමිත අනුව පිළියෙල කරනු ලබයි .ඒ අනුව අනුරූප (format) දෙකක් ලෙස ගිණුම් පිළියෙල කරනු ලබන අතර සමාගමේ ගිණුම්වල අවශ්‍ය ලාභයක් අලාභයක් පෙන්වන අතර සභාව සමුච්චිත අතිරික්තයක් හෝ ඌනතාවයක් පෙන්වනු ලබයි. එම නිසා මේ පිළිබඳව තව දුරටත් රජයේ විගණන අංශය විමසා ඔවුන්ගේ උපදෙස් පරිදී ඒකාබද්ධව ගිණුම් පිළියෙල කරනු ඇත.
1.6 <u>නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම</u> **<u>නීතිරීති රෙගුලාසි ආදියට අනුකූල නොවීම</u>** (අ) 2018 දෙසැම්බර් 07 දිනැති සභාව සතුව නේවාසික අංක PS/SP/SB/21/2018 දරන පාඨමාලා පැවැත්වීම ජනාධිපතිලේකම්ගේ සඳහා පුහුණු චක්‍රලේඛය	අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීම සඳහා පියවර ගෙන ඇත.
මධ්‍යස්ථානවල ප්‍රමාණවත් පහසුකම් තිබියදී 2021 පෙබරවාරි සහ මාර්තු මාසවල බදුල්ල දිස්. පිහිටි පෞද්ගලික ආයතන වල පුහුණු වැඩසටහන් 03 පවත්වා ඒ සඳහා රියදුරන් ඇතුළුව නිලධාරීන් 194 ක වෙනුවෙන් ආහාර හා නේවාසික පහසුකම්	ඉදිරියේදී මෙවැනි ආකාරයේ වැය දැරීම් සිදු නොකරන ලෙසත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී රජය හා ආයතනිකව නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාරව ක්‍රියාකරන ලෙසට සියළු වගකිව

වෙනුවෙන් රු. 3,246,600 ක් වියදම් දරා තිබුණි. (ආ) 2015 සැප්තැම්බර් 25 අවම පිරිවැයක් යටතේ ඉහළ දිනැති අංක SP/SB/07/15 ප්‍රතිලාභ ලභාකර ගත හැකිදරන ජනාධිපති ලේකම්ගේ වන පරිදි උත්සව සංවිධානය චක්‍රලේඛය ක්‍රියාත්මක කළ යුත වුවත්, එරමිණියාය ගොවි පුහුණු මධ්‍යස්ථානයේ 2020 වර්ෂයේ වප්මගුල් හා රන අස්වනු නෙලීමේ උත්සව වෙනුවෙන් එකතුව රු. 399,176 ක් දරා තිබූ අතර , මෙම වියදම තුළ සංග්‍රහ වියදම් හා සභාපති ඇතුළු නිලධාරියකුගේ නවාතැන් පහසුකම් ලෙස රු. 290,250ක හොටෙල් ගාස්තු ඇතුළත් වී තිබුණි.	යුතු නිලධාරීන් වෙත උපදෙස් ලබා දීමට කටයුතු කර ඇත.
2. මූල්‍ය සමාලෝචනය **මූල්‍ය ප්‍රතිඵල** සමාලෝචිතවර්ෂයේමෙහෙයුම්ප්‍රතිඵලයරු. 249,189,000 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.198,007,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 51,182,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට තරුණ සංවර්ධන වියදම් රු .91,951,000 කින් වැඩි වීම හා ආයතන හා පරිපාලන වියදම් රු. 16,362,000 කින් වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.	
3. මෙහෙයුම් සමාලෝචනය **3.1 අනාර්ථික ගනුදෙනු** (අ) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද ශ්‍රී ලංකා යූත් ස්ටාර්ට් අප් වැලේන්ජ් වැඩසටහන යටතේ උප වැඩසටහන් 4 ක් සඳහා 2021 දෙසැම්බර් 20 දින වන විට රු. 1,402,810 ක් වැයකර තිබුණද එම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීම මත එම මුදල නිෂ්ක්‍රීය වියදමක් බවට පත්වී තිබුණි. (ආ) සභාව විසින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට යෝජිත වැඩසටහන් සඳහා සහභාගී වන නිලධාරීන්ට බෙදාහැරීම සඳහා ටී ෂර්ට් සහ කලිසම් එකතුව 7000 ක ප්‍රමාණයක් රු. 4,706,100 ක් වැය කර 2021 අප්‍රේල් 30	ව්‍යාපෘති සැලසුම් පිළියෙළ කිරීමේදී රජයේ මුදල් අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කිරීමට පියවර ගෙන ඇත. මෙම වැඩසටහනට අදාලව සකස් කරන ලද ටී ෂර්ට් 900 මුද්‍රණය කිරීමේදී සුහුරු ගෙවත්ත වැඩසටහන ප්‍රවර්ධනය කිරීමේ අරමුණු සහිතව හරිත ටීවී මාධ්‍ය අනුග්‍රහය යටතේ මෙම ටී ෂර්ට් මුද්‍රණය කරන ලදී.

දින මිලදී ගෙන තිබුණ ද ඉන් 2021 ඔක්තෝබර් 15 දින වන විටත් ගබඩාවේ 5453 ක තොගයක් පැවතුණි. එසේ තිබියදී සුහුරු ගෙවත්ත වැඩසටහන සඳහා 2021 අගෝස්තු 13 හා සැප්තැම්බර් 28 යන දිනයන්හි රු. 643,500 ක් වැයකර ටී ෂර්ට් 900 ක් මිලදී ගෙන තිබුණි.	ගබඩාව සතුව පැවතී ටී ෂර්ට් වෙනත් වැඩසටහනක් සඳහා මුද්‍රණය කරන ලද ඒවා වූ අතර එම ටී ෂර්ට් මෙම වැඩසටහන ප්‍රවර්ධන කිරීම සඳහා යොදා ගත නොහැකි වූ බැවින් ඉහත ටී ෂර්ට් '' සුහුරු ගෙවත්ත'' යන නම යටතේ මුද්‍රණය කරන ලදී. ටී ෂර්ට් මිලදී ගැනීමේ දී ප්‍රසම්පාදන ක්‍රමවේදය අනුව මෙම ගෙවීම් සිදු කර ඇත.ගබඩාව සතුව පවතින ටී ෂර්ට් වෙනත් තරුණ සංවර්ධන වැඩසටහන් සඳහා අවස්ථානුකූලව විධිමත් ක්‍රමවේදයට අනුව නිකුත් කිරීමට පියවර ගැනේ.
(ඇ) කෝවිඩ් රෝගී සත්කාරක සේවාවන්ට සහය දැක්වීමේ අරමුණින් ගිලන් රථ නවීකරණය කර රෝහල්වලට සැපයීමේ වැඩසටහන යටතේ 2021 ජුනි 06 හා 19 දිනයන්හි එරමිණියාය ගොවිපලට රැගෙනවිත් තිබුණු ගිලන් රථ 02 අදාල අලුත්වැඩියාවෙන් තොරව 2021 ජුනි 21 හා 25 දී ගොවිපල පරිශ්‍රයෙන් නැවත රැගෙන ගොස් තිබුණි. ඒ අනුව වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාල සමාරම්භක උත්සවය වෙනුවෙන් දැරූ රු. 149,365 ක මුදල නිෂ්කාර්ය වියදමක් විය.	ඉදිරියේදී රජයේ මුදල් අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කිරීමට පියවර ගෙන ඇත.
(ඈ) නීරෝගීමත් ක්‍රියාශීලී ජීවන රටාවකට තරුණ පරපුර හුරු කිරීම උදෙසා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් හා යෞවන සමාජ මට්ටමින් කායවර්ධන මධ්‍යස්ථාන පිහිටුවීමේ වැඩසටහන යටතේ එරමිණියාය සෞන්දර්ය හා ගොවිපල පුහුණු මධ්‍යස්ථාන භූමියේ කාය වර්ධන මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම හා උපකරණ කට්ටල මිලදී ගැනීම වෙනුවෙන් එකතුව රු. 1,095,258 ක් වැයකර තිබුණද එම මධ්‍යස්ථානය භාවිතා නොකිරීම හේතුවෙන් සම්පූර්ණ වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි.	
(ඉ) 2021 වර්ෂය තුළ ජාතික තරුණ සේවා සභාවේ අරමුණුවලට පරිබාහිර කාර්යයක් ලෙස ලේ දන්දීමේ වැඩසටහනක් පැවැත්වීම සඳහා රු. 11,519,609 ක් වැය කර තිබුණි. මේ සඳහා සභාවේ ගොඩනැගිලි හා උපකරණ භාවිත කිරීමකින් තොරව දිනකට රු. 83,525 ක් බැගින් දින 24 ක් සඳහා රු. 2,004,600 ක් ගෙවා ඩෝම්ස් 01 ක් ආයතන භූමිය තුළ සකස් කිරීම මත එම වියදම නිෂ්කාර්යය වියදමක් බව නිරීක්ෂණය විය.	කාය වර්ධන මධ්‍යස්ථානය යෞවන සමාජ ක්ෂේත්‍රයේ තරුණ තරුණියන් හා මධ්‍යස්ථානයේ අභ්‍යාසලාභීන් වෙත පරිහරණය කිරීම සඳහා මේවන විට පියවර ගනිමින් පවතී. ඉදිරියේදී රජයේ මුදල් අරපිරිමැසුම්දායකව භාවිතා කිරීම ගැන විශේෂ අවධානය යොමු කිරීමට පියවර ගෙන ඇත.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා	
(අ) එරමිණියාය ගොවිපල පුහුණු මධ්‍යස්ථානය තුළ නිසි සැලසුමකින් හා අධීක්ෂණයකින් තොරව ක්‍රියාත්මක කරන ලද කෘෂි බෝග සිටුවීමේ ව්‍යාපෘති 06 කට අදාලව 2021 ඔක්තෝබර් 06 දින සිදුකරන ලද විගණන පරීක්ෂාවට අනුව ගොවිපල නිලධාරීන්ගේ අධීක්ෂණය දුර්වල වීම හා නඩත්තු සිදු නොකිරීම හේතුවෙන් එකතුව රු. 449,133 ක පිරිවැය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි	වැඩසටහන් සැලසුම් කිරීමේදී පිරිවැය අවම වන ආකාරවෙන් කටයුතු කරන ලෙස නිළධාරීන් දැනුවත් කර ඇත.
(ආ) කිසිදු ගාස්තුවක් අයකර ගැනීමකින් තොරව තරුණ සේවා සමාගමට සභාවේ ගොඩනැගිලි භාවිතා කිරීමට ඉඩ පහසුකම් ලබාදී තිබියදීත් ගබඩාවක් සහ රියදුරු 50 කට පමණ නේවාසික පහසුකම් සැපයීමට ඉදිකර තිබුණු පිරිවැය රු. 107,526,046 ක් වූ නව ගොඩනැගිල්ලේ දෙවන මහල අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමකින් තොරව සහ අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතියකින් තොරව සභාපතිවරයා විසින් 2021 ජුනි 10 දින ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගමට ලබාදී තිබුණි. කෙසේ නමුදු 2016 වසරේ සිට වසර පහකට ආසන්න කාලයක් සභාවේ ප්‍රධාන ගබඩාව තාවකාලිකව ස්ථාන 03 ක අනාරක්ෂිතව පැවතුණි.	2022.01.21 දින සී/ස තරුණ සේවා සමාගම විසින් පරිහරණය කරන ලද ගොඩනැගිල්ලේ දෙවන මහල නැවත ජාතික තරුණ සේවා සභාව වෙත පවරා ගැනීම් කර ඇත. සමාගම විසින් පරිහරණය කරනු ලබන කාර්යාල පරිශ්‍රයන් වෙනුවෙන් බිම් කුලී අයකිරීම සඳහා පියවර ගෙන ඇත.
(ඇ) ආදායම් එකතු කර ගැනීම සම්බන්ධව විධිමත් ක්‍රමවේදයක් අනුගමනය නොකිරීම හේතුවෙන් ජාතික තරුණ සේවා සභාවට අයත් එරමිණියාය සෞන්දර්ය හා ගොවිපල පුහුණු මධ්‍යස්ථානයේ සහල් තොග පෞද්ගලික පරිහරණයට ගැනීම, අස්ථානගතවීම හා නාස්ති වීම යනාදී හේතු නිසා වටිනාකම රු. 1,133,142 ක් වූ සහල් කිලෝ ග්‍රෑම් 8435 ක තොගයක් හා බිත්තර නිෂ්පාදනයෙන් රු. 127,579 ක ආදායමක් අහිමි වී තිබුණි.	මේ සම්බන්ධව මූලික විමර්ණයක් සිදුකර ඇති අතර, ඒ අනුව ඉදිරි විනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිතය.
(ඈ) සභාව විසින් සිස්කෝ පරිගණක පුහුණු පාඨමාලාව ආරම්භ කිරීමට සැලසුම් කර සිස්කෝ ජාත්‍යන්තර සමාගම හා සභාව අතර 2020 දෙසැම්බර් 04 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කර ඒ සඳහා 2021 ජූලි 15 දින රු. 15,708,173 ක් වටිනා උපකරණ මිලදීගෙන තිබුණ ද එම උපකරණ 2021 ඔක්තෝබර් 29 දින තෙක්	කාර්මික හා වෘත්තීය පුහුණු අංශය මඟින් ආරම්භ කිරීමට නියමිත CISCO පරිගණක පුහුණු වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා 2020 වර්ෂයේදී සැලසුම් කල අතර එහිදී අදාල විෂය පථය ආවරණය කිරීම සඳහා දැනට සිටින පරිගණක උපදේශකවරුන්ට අදාල විෂය පිළිබඳව CISCO ආයතනය මඟින් ලබා දෙන ප්‍රායෝගික

නිෂ්කාර්යව ගොඩගසා තිබුණි. කෙසේ වුවද, විධිමත් ක්‍රමවේදයකින් තොරව නිලධාරීන් 10 දෙනෙකු අළුතින් බඳවාගෙන ඒ සඳහා 2021 ඔක්තෝබර් වන විට රු. 4,174,874 ක් පමණ සමස්ථ වියදමක් දරා සභාව මඟින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ පරිගණක පාසල සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පුද්ගලික සමාගම යටතේ පිහිටුවීමට කටයුතු කර තිබුණි	පුහුණුව 2020 වර්ෂයේදී හා 2021 වර්ෂයේදී ලබා දීමට සැලසුම් කර තිබුණු නමුත් රට තුල පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මේ වන විට මාතර පුහුණු මධ්‍යස්ථානය , පොල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය ,කුරුණෑගල පුහුණු මධ්‍යස්ථානය හා මහරගම පුහුණු මධ්‍යස්ථානය වෙත අදාල ජාලකරණ උපාංග බෙදා දීමට කටයුතු කර ඇත.
<u>3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු</u> 2020 වර්ෂයේ ආරම්භ කර තිබුණු එරමිණියාය ස්විස් පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් ව්‍යාපෘති හතරක් 2021 ඔක්තෝබර් 10 වන දින දක්වාම නිම කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙම ඉදිකිරීම සඳහා එකතුව රු. 4,563,066 ක් වටිනා ගොඩනැගිලි ද්‍රව්‍ය මිලට ගැනීම සඳහා සැපයුම්කරුවන් දෙදෙනෙකුට ගෙවීම් කර තිබුණිද එම ද්‍රව්‍ය වලින් සියයට 54 ක් හෙවත් එකතුව රු. 2,459,188 ක් වටිනා ද්‍රව්‍ය ඉදිකිරීම් භූමියට ලැබුණු බවට ව්‍යාජ ලේඛන සකස් කර නිලධාරීන් විසින් අයථා පරිහරණය කර තිබුණි. මේ සම්බන්ධව වන අලාභය 2022 අප්‍රේල් දක්වාම වගකිවයුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	මේ සම්බන්ධව මූලික විමර්ශනයක් සිදුකර ඇති අතර, ඒ අනුව ඉදිරි විනය ක්‍රියාමාර්ග ගැනීමට අපේක්ෂිතය.
<u>3.4 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ</u> (අ) තරුණ සංවිධාන හා සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක යුත් ෆෝ යුත් වැඩසටහන සඳහා හා පුහුණු මධ්‍යස්ථාන සඳහා මිලදී ගන්නා ලද එකතුව රු. 10,612,500 ක් වටිනා ඩෙස්ක්ටොප් පරිගණක 83 ක් හා රු. 260,000 ක් වටිනා තන්දූරි උඳුනක් දින 17 සිට මාස 09 දක්වා කාලය තුළ නිෂ්කාර්යව ගබඩා කර තිබුණි. (ආ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ගබඩා තොග උපලේඛනයට අනුව වර්ෂ 22 ක සිට මාස 06 දක්වා ගබඩාව තුළ නිෂ්ක්‍රීයව පවතින රු. 3,653,409 ක් වටිනා තොග ඒකක 25238 ක් පැවතුණි.	කාර්මික වෘත්තීය පුහුණු අංශයේ ප්‍රතිපාදන යටතේ මිලදී ගන්නා ලද ඩෙස්ක්ටොප් පරිගණක 60 අදාල පුහුණු මධ්‍යස්ථානයන් වෙත බෙදා හැර අවසන් කර ඇත. ඉතිරි පරිගණක 23 දිස්ත්‍රික් වලට බෙදා හැරීම සඳහා කටයුතු සිදු කරමින් ඇත. තන්දූරි ගෑස් උඳුන මාතර පුහුණු මධ්‍යස්ථානය වෙත යවා ඇත. නිෂ්ක්‍රීයව පවතින මෙම භාණ්ඩ පිළිබඳව සොයා බැලීම් කර අවශ්‍යතාවය මත ප්‍රයෝජනයට ගත හැකි භාණ්ඩ නිකුත් කිරීම සඳහා පියවර ගෙන ඇත.

3.5 ප්‍රසම්පාදන කළමනාකරණය	
(අ) සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද "බී හැපි විත් යූත්" වැඩසටහන සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කිරීමකින් තොරව ට්‍රක් රථයක සවි කරන ලද වීඩියෝ වොල්එකක් කුලී පදනම මත ලබාගැනීම වෙනුවෙන් 2021 ඔක්තෝබර් 07 දින දක්වා දිනකට රු. 60,500 ක් බැගින් දින 14 ක් වෙනුවෙන් රු. 847,000 ක් ගෙවා තිබුණි.	"බී හැපි විත් යූත්" වැඩසටහන සඳහා සහභාගි වූ සහභාගිකයෙකු සඳහා රු.3000 ක දීමනාවක් ගෙවීම සඳහා වන අනුමැතිය සහා සංදේශ 05/2022 යටතේ 2021.11.22 දින පැවති සභා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත. "බී හැපි විත් යූත්" වැඩසටහනට අදාලව වීඩියෝ වෝල් සහිත ට්‍රක් රථයක් ලබා ගැනීමේදී ඊට අදාලව පෙර ලියාපදිංචි කරගත් සැපයුම්කරුවන් නොමැති වීම හේතුවෙන් හා කොරෝනා19 වසංගතය හේතුවෙන් බොහෝ ආයතන විවෘතව නොතිබීම මත කමිටුවක් මඟින් මිල ගණන් ලබා ගැනීමෙන් අනතුරුව තාක්ෂණික කමිටු නිර්දේශ සහිතව ප්‍රසම්පාදන කාර්යය ඉටු කර ඇත.
(ආ) ජාතික තරුණ සේවා සභාව විසින් නිසි සැලසුමකින් තොරව 2021 දෙසැම්බර් මස රු. ලක්ෂ 240 කට අධික වටිනාකමකින් යුත් මිලදී ගන්නා ලද භාණ්ඩ රාශියක් වර්ෂයකට ආසන්න කාලයක් හෙයියන්තුඩුව පුහුණු මධ්‍යස්ථානයේ ගබඩා කර තිබුණි. එම භාණ්ඩ තුළ වගකීම් කාලය සම්පූර්ණයෙන්ම ඉකුත් වූ එකතුව රු. 1,720,377 ක් වූ Sony Hi Fi System 23 ක් හා මුළු වගකීම් කාලයෙන් අඩක් ඉකුත් වූ එකතුව රු. 3,454,922 ක් වූ රූපවාහිනී හා මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර් 46 ක් හා රු. ලක්ෂ 120 ක් වටිනා කිලෝ ග්‍රෑම් 25 ක රෙදි සෝදන යන්ත්‍ර හා රෙදි වියලන යන්ත්‍ර 03 බැගින් මිලදී ගෙන තිබූ අතර, එම යන්ත්‍ර භාවිතා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.	2022.04.22 දින වන විට මෙම උපකරණ අදාල පාර්ශව වෙත නිකුත් කිරීමට කටයුතු කර ඇත.
(ඇ) 2021 වර්ෂය තුළදී ජාතික තරුණ සේවා සභාව විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමකින් තොරව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා පෞද්ගලික සමාගමට ලබාදී තිබූ රු. 3,045,700 ක් වටිනා මුද්‍රණ ඇනවුම් 08 ක් සමාගම විසින් බාහිර ආයතන මඟින් ඉටුකරවාගෙන සියයට 10 සිට සියයට 108 දක්වා වූ ලාභ ආන්තිකයක් තබාගෙන තරුණ සේවා සභාවට එකතුව රු. 3,886,370 ක වටිනාකමකට ලබාදී තිබුණි.	සමාගම වෙත ලබාදෙන ප්‍රසම්පාදන කාර්යයන් සඳහා ලාභාන්තිකයන් නියම කර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව ප්‍රසම්පාදන කාර්යයන් සිදුකිරීම සඳහා පියවර ගනිමින් පවතී.

3.6 මානව සම්පත් කළමනාකරණය සභාව විසින් විධිමත් බඳවා ගැනීමේ ක්‍රමවේදයකින් තොරව 2021 පෙබරවාරි මස සිට නුපුහුණු ලිපිකරුවන් ලෙස නිලධාරීන් 11 දෙනෙකු බඳවාගෙන ඔවුන්ට දිනකට රු. 1,800 බැගින් 2021 අප්‍රේල් මස දක්වා එකතුව රු. 488,700 ක් ගෙවා තිබුණි.	කළමනාකරණ සහකාර තනතුරේ පවතින පුරප්පාඩු හේතුවෙන් ඇතිවූ සේවා අවශ්‍යතාවය මත එම නිළධාරීන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කර ඇත.